# පටුන


වගු v

රූප viii

**හැඳින්වීම 1**

**පරිච්ඡේදය 01**

**සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය**

1.1.ප්‍රධාන කාර්යයන් සහ වගකීම් ........................................................................6

1.2. කාර්යය සාධනය 2017...............................................................................6

**පරිච්ඡේදය 02**

**ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය**

2.1. ප්‍රධාන කාර්යයන් සහ වගකීම් ....................................................................10

2.2. රක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපිත කිරීම...........................................................10

2.3. වනජීවීන් සඳහා වාසස්ථාන සුපෝෂණය ......................................................12

2.4. 2017 වර්ෂයේ සිදු කරන ලද පාරිසරික ඇගයීම් හා මූලික පාරිසරික ඇගයීම් පිළිබඳ තොරතුරු. ..............................................................................................15

2.5. 2017 වර්ෂයේ ප්‍රකාශයට පත්කල රක්ෂිත ප්‍රදේශ ජාලය ..............................15

**පරිච්ඡේදය 03**

**නීති ක්‍රියාත්මක කිරීම් අංශය**

3.1. ප්‍රධාන කාර්යයන් සහ වගකීම් ....................................................................16

3.2. කාර්යය සාධනයේ විස්තර ..........................................................................16

3.2.1. වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත ක්‍රියාවට නැංවීම..... ...........16

3.3. ක්ෂේත්‍ර නිලධාරීන්ට ප්‍රසාද දීමනා ගෙවීම (2013-2017)...............................18

3.4. වෙනත් කටයුතු..........................................................................................19

**පරිච්ඡේදය 04**

**අලි සංරක්ෂණ අංශය**

4.1. ප්‍රධාන කාර්යයන් සහ වගකීම් ................................................………… 21

4.2. කාර්යසාධනයේ විස්තරය ...............................................................................21

4.2.1. අලි මිනිස් ගැටුම ......................................................... 21
4.2.2. විදුලි වැට ඉදිකිරීම ......................................................... 25
4.2.3. 2017 වර්ෂය තුළදී අලිවෙඩි බෙදාදීම ......................................................... 26
4.2.4. වනඅලි හානි සඳහා වන්දි ගෙවීමේ වැඩසටහන ......................................................... 27
4.2.5. කරදරකාරී වනඅලින් අල්ලා ඉවත් කිරීම - 2017 ......................................................... 29
4.2.6. වන අලි පලවා හැරීම - 2017 ......................................................... 29
4.3. වන අලි මිනිස් ගැටුම අවම කිරිමට ගෙන ඇති ක්‍රියාමාර්ග ……....................29

**පරිච්ඡේදය 05**

**පර්යේෂණ හා පුහුණුඅංශය**

5.1. ප්‍රධාන කාර්යයන් සහ වගකීම් ....................................................................31
5.2. පර්යේෂණකටයුතු..........................................................................................31
5.3. පුහුණුකටයුතු ...............................................................................................32
5.4. ව්‍යාප්ති, අධ්‍යාපන හා විවරණ කටයුතු .....................................................36
5.5. දෙපාර්තමේන්තු ප්‍රකාශන හා ප්‍රචාරක වැඩසටහන් ......................................36

**පරිච්ඡේදය 06**

**සංචාරක සේවා කළමණාකරන පාරිසරික සංචාරක හා ජනවිහිදුම්කරණ අංශය**

6.1. ප්‍රධාන කාර්යයන් සහ වගකීම් ....................................................................38
6.2. කාර්යසාධනයේ විස්තර ........................................................................... 38
6.2.1. සංචාරකයින් සහ ආදායම ......................................................... 38
6.2.2. ස්වෙච්ඡා මාර්ගෝපදේශකයින් ......................................................... 41
6.3. ජනවිහිදුම්කරණය ……………………………………………………….. 43
6.3.1. කාර්යය සාධනයේ විස්තර ......................................................... 43
6.3.2. ජනවිහිදුම්කරණ මගින් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති සහවැඩසටහන් - 2017 ............................................................ 43

**පරිච්ඡේදය 07**

**වනජීවි සෞඛ්‍ය කළමනාකරණ අංශය**

7.1. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වගකීම්...............................................................47
7.2. 2017 වර්ෂයේ කාර්ය සාධනය ....................................................................47

**පරිච්ඡේදය 08**

**ඉංජිනේරු අංශය**


8.1. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වගකීම්..............................................................50

8.2.වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන සහ කාර්යාලයේ ක්ෂේත්‍රයේ ගොඩනැගිලි ඉදිකිරීම සහ අළුත්වැඩියා කිරීම ....................................................50

8.3.මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම ..............................................................57


**පරිච්ඡේදය 09**

**පාලන අංශය**


9.1. ප්‍රධාන ක්‍රියකාරකම් සහ වගකීම්................................................................60

9.2. බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි ......................................................60

9.2.1 කාර්ය මණ්ඩල බඳවා ගැනීම් ...................................................................60

9.2.2 උසස්වීම්……………………………………………………………… 61

9.2.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමත කර ගන්නා ලද බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටි.............................................................................................61

9.3. කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ - 2017...................................................61

9.4. විනය පරීක්ෂණ ............................................................................................61

9.5. අග්‍රහාර අරමුදල් ප්‍රතිලාභ ගෙවීම ..............................................................61

9.6. විශ්‍රාම ගෙවීම් සහ මරණ පාරිතෝෂිත ..........................................................61

9.7. හදිසි අනතුරු වන්දි ගෙවීම් .........................................................................62

9.8. ණය පහසුකම්...............................................................................................62

9.9. ජංගම සේවා පැවැත්වීම.................................................... ....... .62


**පරිච්ඡේදය 10**

**මුදල් අංශය**


10.1.ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වගකීම්..............................................................63

10.2.ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම. ........................................63

10.3.වනජීවි සංරක්ෂණ අරමුදල (WPF) ............................................................64

10.4.සමස්ත මූල්‍ය ප්‍රගතිය - 2017.......................................................................64

**පරිච්ඡේදය 11**

**පරිසර පද්ධති සංරක්ෂණ හා කළමණාකරණ ව්‍යාපෘතිය (ESCAMP).......... 68**

11.1. ප්‍රධාන ව්‍යාපෘති සංරචක ........................................................................ 68

11.2. වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ යටතේ ක්‍රියාත්මක විමට නියමිත ව්‍යාපෘති.......................................................................................................70

11.3. 2017 වසරේදී මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද කාර්යන්ගේ ප්‍රගතිය....72

## වගු


වගුව 1.1 : ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය -2017 ........ 9
වගුව 2.1 : රක්ෂිත ප්‍රදේශ මායිම් මිනුම් කිරීම හා සලකුණු කිරීම -2017 ........ 10
වගුව 2.2: දැන්වීම් පුවරු ස්ථාපනය හා ප්‍රතිසංස්කරණය කිරීම - 2017 ........ 11
වගුව 2.3: වනජීවී කලාප වල තෘණභූමි කළමනාකරණය - 2017 ........ 13
වගුව 2.4: ආක්‍රමණශීලි ශාක විශේෂ ඉවත් කිරීම - 2017 ........ 13
වගුව 2.5: ජල මූලාශ්‍ර ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය - 2017 ........ 13
වගුව 2.6: යටි වගාව ඉවත් කිරීම/යටි වගාව නඩත්තු කිරීම - 2017 ........ 14
වගුව 2.7: ගිනිපටි කළමනාකරණය - 2017 ........ 14
වගුව 2.8: වෙනත් සංවර්ධන කටයුතු - 2017 ........ 14
වගුව 2.9: පාරිසරික ඇගයීම් හා මූලික පාරිසරික ඇගයීම් පිළිබඳ තොරතුරු-2017 ........ 15
වගුව 2.10: ගැසට් තුලින් ප්‍රකාශ කල උතුරු පළාතේ රක්ෂිත ප්‍රදේශ ජාලය-2017 ........ 15
වගුව 3.1: පවරන ලද වනජීවී අපරාධ සම්බන්ධ නඩු සංඛ්‍යාව 2017 ........ 17
වගුව 3.2: නිකුත් කරන ලද ආනයන අපනයන බලපත්‍ර සංඛ්‍යාව (2012-2017) ........ 19
වගුව 3.3: 2017 වසරේ ක්‍රියාකාරී සැලැස්මේ සංවර්ධන වැඩ සටහන්වල ප්‍රගතිය ........ 20
වගුව 4.1: වනජීවී කලාපවල අලි මරණ ව්‍යාප්තිය (2013-2017) ........ 22
වගුව 4.2: අලි මරණ සඳහා හේතූන් 2017 ........ 22
වගුව 4.3: අලි ප්‍රහාර හේතුවෙන් සිදුවූ වාර්ෂික මිනිස් මරණ (2013 - 2017 ........ 23
වගුව 4.4: අලි ප්‍රහාර හේතුවෙන් සිදුවූ වාර්ෂික මිනිස් මරණ වර්ගීකරණය ........ 23
වගුව 4.5: දේපළ හානි ව්‍යාප්තිය (2013-2017) ........ 23
වගුව 4.6: ශාරීරික හානි ව්‍යාප්තිය (2013-2017) ........ 24
වගුව 4.7:2017 වර්ෂයේ දී ඉදිකරන ලද නව විදුලි වැටවල් ........ 25
වගුව 4.8: ගිඟුම් වෙඩි සහ සංඥා වෙඩි මිලදී ගැනීම-2017 ........ 27
වගුව 4.9:ගිඟුම් වෙඩි සහ සංඥා වෙඩි බෙදාහැරීම - 2017 ........ 27
වගුව 4.10: වනඅලි හානි වන්දි ගෙවීම සඳහා අනුමත වන්දි ගෙවීමේ උපරිම සීමාවන් වෙනස් වීම ........ 28
වගුව 4.11:වන්දි ගෙවීම් - 2017 ........ 28
වගුව 4.12: කරදරකාරී වන අලින් අල්ලා ඉවත් කිරීම – 2017 29
වගුව 4.13: වන අලි පලවා හැරීම – 2017 29
වගුව 4.14: 2017 වසරේ ක්‍රියාකාරී සැලැස්මේ සංවර්ධන වැඩ සටහන්වල ප්‍රගතිය ........ 29

වගුව 5.1: වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදු කරන ලද අනුමත පර්යේෂණ අධ්‍යනයන් - 2017 ........ 32
වගුව 5.2: සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් - 2017 32
වගුව 5.3: 2017 වර්ෂය තුළ පවත්වන ලද වනජීවී නිලධාරීන් සඳහා කෙටිකාලීන විශේෂ පුහුණු වැඩසටහන් ........ 33
වගුව 5.4: 2017 වර්ෂය තුළ බාහිර ආයතන මගින් පවත්වන ලද පුහුණු වැඩසටහන් 33
වගුව 5.5: 2017 වසරේ ජාතික වනජීවී පුහුණු කේන්ද්‍රය පවත්වන ලද නිත්‍ය පුහුණු වැඩසටහන් ........ 34
වගුව 5.6: 2017 වර්ෂය තුළ වනජීවී නිලධාරීන් සහභාගී වූ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් ........ 34
වගුව 5.7: 2017 වසරේ පවත්වන ලද සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ දැනුවත්කිරීමේ වැඩසටහන් ........ 36
වගුව 5.8: 2017 වසරේ මුද්‍රිත ප්‍රකාශන -දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ........ 37
වගුව 5.9: 2017 වසරේ මුද්‍රිත ප්‍රකාශන -බාහිර ආයතන වලින් ලද ප්‍රතිපාදන යටතේ ........ 37
වගුව 5.10: 2017 වර්ෂයේ මාධ්‍ය ක්‍රියාකාරකම් ........ 37
වගුව 6.1: සංචාරක සේවාවන්හි වාර්ෂික ආදායම - 2017 ........ 38
වගුව 6.2: සංචාරකයින් වර්ගීකරණය - 2017 ........ 40
වගුව 6.3: ජාතික උද්‍යානවල සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීමට ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් - 2017 ........ 42
වගුව 6.4: HSBC -පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය - 2017 ........ 43
වගුව 6.5: ජනවිඥුම්කරන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය - 2017 ........ 44
වගුව 7.1: 2017 වසරේ වන සතුන්ට ප්‍රතිකාර කිරීම ........ 47
වගුව 7.2: 2017 වසරේ වන සතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ ........ 48
වගුව 7.3: 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ........ 49
වගුව 8.1: 2017 වර්ෂයේ ක්ෂේත්‍ර ගොඩනැගිලි අළුත්වැඩියා කිරිම ........ 50
වගුව 8.2: 2017 වර්ෂයේ නව ගොඩනැගිලි ඉදිකිරීම ........ 55
වගුව 8.3: මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම - 2017 ........ 58
වගුව 9.1: බඳවා ගැනීම් - 2017 ........ 60
වගුව 9.2: කාර්යක්ෂමතා කඩඉම් විභාග -2017 ........ 61
වගුව 9.3: අග්‍රහාර අරමුදල් ගෙවීම - 2017 ........ 61
වගුව 9.4: විශ්‍රාම ගෙවීම් සහ මරණ පාරිතෝෂිත ........ 61

වගුව 9.5: හදිසි අනතුරු වන්දි ගෙවීම් 62
වගුව 9.6: ණය පහසුකම් - 2017 62
වගුව 10.1: කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ, සහ යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම - 2017 64
වගුව 10.2: වනජීවි සංරක්ෂණ අරමුදලේ වියදම් (2013-2017) 64
වගුව 10.3: සමස්ත මූල්‍ය ප්‍රගතිය 2017 65
වගුව 10.4: 2017 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අයවැය විස්තර 65
වගුව 10.5: 2017.12.31 දිනට වනජීවි සංරක්ෂණ අරමුදල් ගිණුමේ අයවැය.......... 66
වගුව 11.1: වනජීවී රක්ෂිත ප්‍රදේශ අවට ජනතාවගේ ජීවණෝපාය සංවර්ධනය කිරීම (ඇමෙරිකන් ඩොලර් මි. 6) ........................................................................ 72
වගුව 11.2: අලි-මිනිස් සහ පැවත්ම තුලින් වනඅලි හානි අවම කිරිම (ඇමෙරිකන් ඩොලර් මි.11) 72
වගුව 11.3: වනජීවී රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය සහ කළමණාකරනය (ඇමෙරිකන් ඩොලර් මි. 11.6) 73
වගුව 11.4: වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කටයුතු වැඩි දියුණු කිරීම (ඇමෙරිකන් ඩොලර් මි. 6) 73
වගුව 11.5: ආයතන ධාරිතාව සහ ආයෝජන හැකියාව වර්ධනය කිරීම (ඇමෙරිකන් ඩොලර් මි. 6.6 74

## රූප

**රූපය 3.1:**පවරන ලද නඩු සංඛ්‍යාව (2013 – 2017) 17
**රූපය3.2:**උසාවි දඩමුදල් වලින් ලද ආදායම (2013 - 2017) 18
**රූපය3.3:** ප්‍රසාද දිමනා ගෙවීම් (2013-2017) 18
**රූපය 6.1:** සංචාරක සේවාවන්හි වාර්ෂික ආදායම (2011-2017) 40
**රූපය 6.2:** සංචාරක කණ්ඩායම් බෙදී යන ආකාරය 41
**රූපය 6.3:** 2017 වසරේ සංචාරක ව්‍යාප්තිය 42
**රූපය 6.4:** 2017 වසරේ සංචාරක පැමිණීම (2011-2017) 42
**රූපය 6.5:** ස්වෙච්ඡාමාර්ගෝපදේශකයින්සංඛ්‍යාව 2011-2017 43

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දේශීය ශාක හා සත්ත්ව ප්‍රජාවන් සංරක්ෂණය කිරීම ජාතික වශයෙන් ප්‍රමුඛ අවශ්‍යතාවයකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ සමුද්‍ර තිරය ඇතුළු දේශ සීමාව තුළ වනජීවී සම්පත් දිගු කාලීනව ආරක්ෂා කිරීමේ හා සංරක්ෂණය කිරීමේ ප්‍රමුඛ කාර්යභාරය පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටය. ඒ සඳහා වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ ශ්‍රී ලංකාව තුළ වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලයක් ස්ථාපිත කර කළමනාකරණය කිරීමේ නීතිමය වගකීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර එසේ ස්ථාපිත කරන ලද රක්ෂිත භූමි ප්‍රමාණයේ මුළු එකතුව වර්ග කි.මී. 8500 ක් ඉක්මවයි. එය ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 14% ක් පමණ වේ. පහත දැක්වෙන වගුවෙහි දැක්වෙන්නේ ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත් කර ස්ථාපිත කරන ලද වනජීවී රක්ෂිත භූමි වර්ග සහ ඒවායේ සංඛ්‍යාවන්ය. මෙරට වනජීවී රක්ෂිත දිවයින තුළ ව්‍යාප්තව ඇති ආකාරය ඇමුණුම 1 හි දැක්වේ.

| **රක්ෂිත ප්‍රදේශ වර්ගය** | | **දැනට ප්‍රකාශයට පත්කර ඇති සංඛ්‍යාව 2017 දෙසැම්බර් දක්වා** |
|---|---|---|
| ජාතික රක්ෂිත | දැඩි ස්වභාව රක්ෂිත | 03 |
| | ජාතික උද්‍යාන | 26 |
| | ස්වභාව රක්ෂිත | 09 |
| | වන පිවිසුම් | 01 |
| **එකතුව** | | **39** |
| අභයභූමි | | 62 |
| **මුළු එකතුව** | | **101** |

වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වනජීවී රක්ෂිතවලින් බැහැර පෙදෙස් වල වනජීවී සම්පත් ආරක්ෂා කිරීම හා අදාළ නීතිමය ප්‍රතිපාදනද පනවා ඇති අතර ඒ සඳහා අවශ්‍ය නීතිමය බලයද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

විවිධත්වයෙන් පොහොසත් මෙරට ජෛව සම්පත් ඒවායේ ස්වභාවික වාසස්ථාන සමඟ සංරක්ෂණය කරනවාට අමතර වශයෙන් වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය ශ්‍රී ලංකාව තුළ පවත්නා කෘෂිකර්මාන්තයට සහ විදුලි බල නිෂ්පාදනයට වැදගත් වන විශාල ප්‍රමාණයේ ජලාශ සහ ඒවායේ පෝෂක ප්‍රදේශ වලද දිගු කාලීන ආරක්ෂාව තහවුරු කරයි. සේනානායක සමුද්‍රය ඇතුළු ගල්ඔය නිම්නයේ ජලාශ සියලුම මහවැලි ජලාශ,මධ්‍යම සහ උතුරු මැද පළාත්වල පිහිටි මහවැලි ගඟෙන් ජලය ලබා ගන්නා ජලාශ, උඩවලව, මව්ආර, ලුණුගම්වෙහෙර සහ වෙහෙරගල යනාදී මෙරට දකුණු ප්‍රදේශයේ පවත්නා ජලාශ, වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ පිහිටයි. තවද, පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල, මින්නේරිය, ගිරිතලේ, පදවිය, කලාවැව සහ

යෝධ වැව වැනි ප්‍රධාන වැව් රාශියකද ජල පෝෂක ප්‍රදේශ වනජීවී රක්ෂිත ප්‍රදේශ ලෙස සංරක්ෂණයට ලක්කර ඇත. මෙසේ වනජීවී රක්ෂිත ප්‍රදේශ තුළ පිහිටන කෘෂිකාර්මාන්තය සහ ජල විදුලිය නිෂ්පාදනය සඳහා වැදගත් වන ජලාශ සංඛ්‍යාව 40 ඉක්මවයි.

එමෙන්ම ශ්‍රී ලංකාවේ ස්වාභාවික පරිසර ආශ්‍රිතව සංචාරක කර්මාන්තයේ ප්‍රධාන විභවයක් වන්නේ ද වනජීවී රක්ෂිත තුළ පවතින වනජීවී සම්පත් වන අතර වනජීවී රක්ෂිත ආශ්‍රිත පරිසර කර්මාන්තය තුළින් 2017 වර්ෂය තුළ ලබා ඇති ආදයම රුපියල් මිලියන 2500 ඉක්මවා ඇත.ඉන් වැඩි ප්‍රතිශතයක් විදේශ විනිමය වේ.

තවද මහවැලි, කැළණි, කළු සහ වලවේ යන ප්‍රධාන ගංගාවල්වල ඉහළ ජල පෝෂක ප්‍රදේශද පිහිටා ඇත්තේ ශ්‍රී පාද අඩවිය ස්වභාව රක්ෂිතය, හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය වැනි වනජීවී රක්ෂිත තුළය.මෙකී තත්වයන් යටතේ ශ්‍රී ලංකාව තුළ පවත්නා ඉතා වටිනා ස්වභාවික පරිසර පද්ධතීන් සහ ඒවායේ ඇති සම්පත් මනා වෘත්තිමය කළමනාකරණයක් සහ සංරක්ෂණයක් සිදුකිරීම සඳහා ආධාරවන පරිදි මෙම දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර සංවිධානය කර ඇත.

**දැක්ම: වර්තමාන සහ අනාගත පරම්පරාවන් සඳහා වනජීවී උරුමයන් සංරක්ෂණය කිරීම**

**මෙහෙවර : සහභාගිත්ව කළමනාකරණය මඟින් වනජීවී උරුමයන් සංරක්ෂණය තහවුරු කිරීම**

ශ්‍රී ලංකාවේ ජාතික වනජීවී ප්‍රතිපත්තියේ නිර්ණායකයන්ට අනුව ජාතික සහ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරන ලද උපායමාර්ග, සැලසුම් සහ වැඩසටහන් මඟින් ජාතික ආර්ථිකයට මහත් දායකත්වයක් සපයන පරිදි මෙම වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය කළමනාකරණය කරනු ලැබේ.

වර්තමාන ගෝලීය දැක්ම අනුව විද්‍යාත්මකව තීරණ ගැනීම, සංකීර්ණ දත්ත හා තොරතුරු වඩා කාර්යක්ෂමව සන්නිවේදනය සහ කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය තුලනය කළහැකි වන පරිදි පිළියෙල කළ දිගුකාලීන කළමනාකරණ සැලසුම්, අමුත්තන් සඳහා අධ්‍යාපනික සහ විනෝදාශ්වාද අවස්ථා විවිධත්වයක් සහිතව සැපයීම සහභාගිත්ව කළමනාකරණය සහ ප්‍රතිලාභ සාධාරණ ලෙස පාර්ශවකරුවන් අතර බෙදීයාමට සැළැස්වීම මඟින් ප්‍රාදේශීය ප්‍රජාවන් සංරක්ෂණයට දායක කර ගැනීම වැනි ක්ෂේත්‍ර සඳහා වැඩි අවධානයක් යොමු වෙමින් පවතී.

මේ තත්වය යටතේ වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ තම මෙහෙයුම් අඛණ්ඩව වැඩිදියුණු කරමින් ක්‍රියාත්මක කිරීමට පෙළඹී ඇත. ඒ අනුව හඳුනාගත් දෙපාර්තමේන්තුවේ අරමුණු පහත පරිදිය.

- ජාතික හා අන්තර් ජාතික ප්‍රතිපත්තීන් හා ගැලපෙන අයුරින් වනජීවි සම්පත් සංරක්ෂණය සඳහා උපායමාර්ගික ජාතික සැලසුම් සහ වැඩසටහන් සම්පාදනය කිරීම.
- සුවිශේෂී විද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථානද සහිතව රට තුළ පවත්නා සියලුම ස්වභාවික පරිසර පද්ධතීන් නියෝජනය වන පරිදි රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම ඒවා කාලානුරූපව සහ වනජීවී විශේෂවල ධරණීය ගහන පවත්වා ගෙන යාහැකි ආකාරයට සංඛ්‍යාත්මකව සහ ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සහ ඒවා අතර සම්බන්ධතා ස්ථාපිත කිරීම.
- වඩාත් සුදුසු පර්යේෂණ දත්ත හා තොරතුරු මත පදනම්ව රක්ෂිත ප්‍රදේශ හඳුනාගැනීම, වර්ගීකරණය කිරීම හා කළමනාකරණය කිරීම සහ ඒවායේ තත්ත්වයන් යාවත්කාලීන සුපරීක්ෂාව.
- අන්තරායට ලක් වූ විශේෂ සඳහා සංරක්ෂණ සැලසුම් පිළියෙල කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.
- අදාළ රක්ෂිත ප්‍රදේශ තුළ පරිසර පද්ධතීන් සංරක්ෂණය කරන අතරම පාරිසරික සංචාරක කටයුතු සඳහා ඇති අවස්ථාවන් භාවිතා කිරීමේ පහසුකම් සැපයීම.
- රට තුළ වනජීවි සම්පත් වල නීතිවිරෝධී භාවිතයන් අවම කිරීම සඳහා වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සහ වෙනත් රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාව තුළ වනජීවි සම්පත් කළමනාකරණයට අදාළ වන විද්‍යාත්මක පර්යේෂණ දිරිගැන්වීම.
- පුහුණු කිරීම්, දිරිගැන්වීම සහ අභිප්‍රේරණය මගින් වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීම.
- අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් මහජනතාව තුළ සංරක්ෂණය සඳහා දක්වන දායකත්වය ඉහළ නැංවීම.
- රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන් එකී රක්ෂිත ප්‍රදේශ මත යැපීම අඩුකිරීම සහ එම ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම මඟින් සංරක්ෂණය සඳහා එකී ප්‍රජාවන්ගේ දායකත්වය ඉහළ නැංවීම.

වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර අනුව කටයුතු කිරීම සඳහා ප්‍රධාන කාර්යාල මට්ටමින් ප්‍රධාන තාක්ෂණික අංශ 08කි. ඒවා නම්, සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය, ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය, අලි සංරක්ෂණ

අංශය, සංචාරක සේවා කළමනාකරණ පාරිසරික සංචාරක හා ජනවිභිදුම්කරණ අංශය, පර්යේෂණ හා පුහුණු අංශය, නීති ක්‍රියාත්මක කිරීම් අංශය සහ වනජීවි සෞඛ්‍ය අංශය වේ. එයට අමතරව ගිණුම්, පරිපාලන සහ ඉංජිනේරු අංශ පෙරකී තාක්ෂණික අංශ සඳහා සහායක කාර්යභාරයක් ඉටුකරයි. මෙම අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර අංක 1 සිට 10 දක්වා පරිච්ඡේදවල දක්වා ඇත.

තවද ලෝක බැංකු ආධාර මත පරිසර පද්ධති සංරක්ෂණ හා කළමණාකරණ ව්‍යාපෘතිය (ESCAMP) 2017-2021 දක්වා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනසංරක්ෂණ දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක වන අතර මේ සඳහා ඇමෙරිකන් ඩොලර් මි. 45ක ප්‍රතිපාදන වෙන් වී ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ තෝරාගත් රක්ෂිත ප්‍රදේශවල ඇතුලත හා පිටත ගොඩබිම්, සමුද්‍රීය සහ තෙත් බිම් පරිසර පද්ධති කළමනාකරණ ක්‍රියාවලීය වැඩිදියුණු කිරීම වේ. ඒ අනුව 2017 වසරේදී මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද කාර්යන්ගේ ප්‍රගතිය පරිච්ඡේද 11 මගින් දක්වා ඇත.

දීප ව්‍යාප්තව ස්ථාපිත කර ඇති වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ හා ඉන් බාහිරව සිදුකළ යුතු වනජීවී සංරක්ෂණ කටයුතු ප්‍රාදේශීය වශයෙන් මෙහෙයවීමට සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය පරිපාලන කලාප 12 ක් ස්ථාපිත කර ඇත . එකී කලාප 12 (ඇමුණුම 1) න් දැක්වේ. ඉහත එක් එක් කලාපයේ ප්‍රධානියා නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ වරයෙකු වන අතර එකී කලාපය තුළ පිහිටන රක්ෂිත ප්‍රදේශ ජාලය අඩවි හා බීට්ටු ලෙස නැවත බල ප්‍රදේශ වලට වෙන්කර පාලනය කරනු ලැබේ.

වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තුළ වනජීවි සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ දැනුම කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා ගිරිතලේ පිහිටි ජාතික වනජීවී පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය විසින් නිත්‍ය පුහුණු පාඨමාලා පැවැත්වීම මඟින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම උදෙසා රු.මි.758 ප්‍රතිපාදන ඒකාබද්ධ අරමුදලින් ලැබුණි. ඊට අමතරව වනජීවි සංරක්ෂණ අරමුදලේ ප්‍රතිපාදන ද මොරගහකන්ද සහ වෙහෙරගල ව්‍යාපෘති යටතේ වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් ලැබෙන ප්‍රතිපාදන ද දානපතීන් සහ ආධාර සපයන ආයතන වලින් ලැබෙන මුදල් ද විවිධ සංරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට යොදාගන්නා ලදී.

2017 වර්ෂ අවසාන ගිණුම් වලට අනුව පුනරාවර්තන වියදම් 100% ක් ලෙසද ප්‍රාග්ධන වියදම් 87% ක් ලෙසද සතුටුදායක මූල්‍ය ප්‍රගතියක් පෙන්වා ඇත. (වගුව 10.3)

# පරිච්ඡේදය 01

## සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය

### 1.1.ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම.
- විශේෂ සංවර්ධන සහ සංරක්ෂණ කටයුතු සඳහා ව්‍යාපෘති යෝජනා සැකසීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රගතිය පසුවිපරම් කිරීම.
- මාසික, ත්‍රෛයිමාසික හා වාර්ෂික වාර්තා පිළියෙල කිරීම.
- දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරීම.
- දෙපාර්තමේන්තුවේ www.dwc.gov.lkවෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු දීපව්‍යාප්ත රේඩියෝ සන්නිවේදන පද්ධතිය නඩත්තුව, කළමනාකරණය සහ වැඩිදියුණු කිරීම.
- දෙපාර්තමේන්තුව සතු අභ්‍යන්තර දුරකථන ජාල පද්ධතිය කළමනාකරණය, නඩත්තුව සහ වැඩිදියුණු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දීප ව්‍යාප්ත පරිගණක ජාලය කළමනාකරණය, නඩත්තුව හා වැඩිදියුණු කිරීම.
- ජාතික උද්‍යානවල ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම පරිගණකගත කිරීම.
- GIS ඒකකය කළමනාකරණය

### 1.2. කාර්යයසාධනය 2017

2017 වර්ෂය තුළදී පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

- **ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම**

වනජීවී සංරක්ෂණදෙපාර්තමේන්තුවේ 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කර තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

- **ප්‍රගතිය වාර්තා කිරීම**

මාසික සහ කාර්තුමය ප්‍රගතිය දැක්වෙන වාර්තා පිළියෙල කර නියමිත පරිදි තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.ඊට අමතරව එක් එක් ආයතන වලින් ඉල්ලා සිටින පරිදි පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාද එකී ආයතන වෙත ලබා දෙන ලදී.

- **කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම**

ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙනත් සංරක්ෂණ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය විදහා දැක්වෙන පරිදි තොරතුරු යොදාගනිමින් 2017 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව පිළියෙල කරන ලදී.

- **විශේෂ ව්‍යාපෘති යෝජනා පිළියෙල කිරීම**

රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ සංවර්ධන සහ සංරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය විසින් ව්‍යාපෘති යෝජනා පිළියෙල කර මහාභාණ්ඩාගාරය සහ වෙනත් මූල්‍ය ප්‍රභව වලට ඉදිරිපත් කරන ලදී.

- **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු Wide Area Network කළමනාකරණය**

වර්තමාන පරිගණක පද්ධතියේ පවතින අලුත්වැඩියාවන් හා පාලන කටයුතු සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලදී. මෙම ක්‍රියාකාරකම් තුළ පරිගණක හා උපාංග අලුත්වැඩියා, පුළුල් ප්‍රදේශ ජාලගතකරණයේදී සිදුවන අවහිරතා ඉවත් කිරීම්, පරිගණක සඳහා නව මෘදුකාංග හා දෘඩාංග ස්ථාපිත කරමින් ජාලයේ කටයුතු පවත්වාගෙන යාම වේ.

- **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ www.dwc.gov.lkවෙබ් අඩවිය කළමනාකරණය කිරීම.**

දැනට භාවිතා කරනු ලබන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය අධ්‍යාපනික හා පර්යේෂණ වටිනාකමක් ඇති දත්ත හා තොරතුරු ඇතුළත් කරමින් අඛණ්ඩවම යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී. මෙම සමස්ත කාර්යාවලිය සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලදී.

- **රේඩියෝ සන්නිවේදන ජාලය**

දැනට භාවිතාවන රේඩියෝ සන්නිවේදන පද්ධතියේ ආවරණ කලාපය වැඩිදියුණු කිරීම, යාවත්කාලීන නඩත්තු කටයුතු සිදුකිරීම සහ බාධාවලින් තොරව සන්නිවේදන ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මඟින් මෙම ජාලය මගින් සිදුකරන ලදී. මෙම සමස්ත කාර්යාවලිය සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයට අනුයුක්ත තාක්ෂණ ශිල්පීන් විසින් ක්‍රියාත්මක කරන ලදී.

- **GIS ඒකකය කළමනාකරණය කිරීම**

ක්ෂේත්‍රයේදී රැස්කරන ලද GPS දත්ත භාවිතා කරමින් විවිධ අවශ්‍යතාවන් සඳහා අදාළ වන විවිධ තේමාවන් යටතේ සිතියම් පිළියෙල කරන ලදී. ඒ යටතේ සිතියම් පිළියෙල කල ප්‍රධාන තේමාවන් පහත දැක්වේ.

- පවත්නා සහ යෝජිත විදුලිවැට
- අළුතින් යෝජිත අලි සංරක්ෂණ කලාප හා අලි සංචිත කළමනාකරණය

එයට අමතරව සුවිශේෂී තේමා යටතේ පිළියෙල කිරීමට ඉල්ලුම් කරන ලද සිතියම්ද ප්‍රධාන කාර්යාලීය අංශ සහ ක්ෂේත්‍ර කාර්යාලවල ඉල්ලීම පරිදි සිදුකරන ලදී.

- **Wildlanka Symposium පර්යේෂණ සැසිය**

Wildlanka Symposium පර්යේෂණ සැසිය වනජීවී ප්‍රවීණයින්,විද්‍යාඥයින් , වීශ්වවිද්‍යාල ආචර්යවරුන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, වනජීවී කළමණාකරුවන්,ප්‍රතිපත්ති සම්පාදකයින් හා අනෙකුත් වනජීවි ලෝලීන් අතර නවතම විද්‍යාත්මක දැනුම ලබාදෙන තෝතැන්නකි. “දේශගුණික වෙනස්කම් සහ සංරක්ෂණය”මෙවර (2017 )පර්යේෂණ සැසියේ තේමාව වු අතර එය අගෝස්තු 15 හා 16 දෙදින තුල කොළඹ “Taj Samudra” පරිශ්‍රයේදි පැවැත්විණි.එහි වාචික සහ පොස්ටර් ලෙස සැසිවාර 02 ක් පැවැත්විණි.ඉදිරිපත් කිරිම් 75 න් 05 දෙනෙක් වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරන පර්යේෂකයින් වූ අතර 10 දෙනෙක් විදේශිකයන්ය.

- **වයිල්ඩ් ලංකා- වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සඟරාව**

වයිල්ඩ් ලංකා අන්තර්ජාතික පර්යේෂණ සඟරාව දැනට අවුරුද්දකට වෙළුම් 04 කින් යුතුව ප්‍රකාශයට පත් කරන අතර 2017 වර්ෂයේදී ගුණාත්මකභාවයෙන් ඉහළ දෙස් විදෙස් පර්යේෂණ වාර්තා රාශියක් ප්‍රකාශයට පත් කර ඇත.එහි කතෘ මණ්ඩලය පිළිගත් දෙස් විදෙස් විශ්වවිද්‍යාල අඳුරු මණ්ඩලයකින් සහ ප්‍රවීණ විද්‍යාඥයන්ගේන් සමන්විතයි. මෙය දෙපාර්තමේන්තුව අන්තර්ජාතික පිළිගැනීමකට ලක්වීමට මහත් පිටුවහලක් විය.

- **වනදිවි තෙත් බිම් අත් පත්‍රිකාව**

වනදිවි තෙත් බිම් අත් පත්‍රිකාව වර්ෂයකට වෙළුම් 02 ක් ලෙස ප්‍රකාශයට පත් කරයි.2017 වර්ෂයේ එහි පළමු වෙළුම පෙබරවාරි 02 වැනිදාට යෙදි තිබුණු ලෝක තෙත් බිම් දිනයේදිත් දෙවන් වෙළුම ඔක්තෝම්බර් 01 වැනිදාටත් ප්‍රකාශයට පත්කරන්නට යෙදුණි

- **2017 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ක්‍රියාකාරකම් සම්බන්ධ වැඩසටහන.**

2017 වර්ෂය තුළදී සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් වගුව 1.1 හි දැක්වේ.

වගුව **1.1 : ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය -2017**

| **අනු අංකය** | **ක්‍රියාකාරකම්** | **භෞතික ප්‍රගතිය %** | **මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)** |
|---|---|---|---|
| 01 | පරිගණක 190 ක් සඳහා Virusgard යෙදීම | 60% | 0.30 |
| 02 | ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ පරිගණක පද්ධතිය යාවත්කාලීන කිරීම | 29% | 0.23 |
| 03 | තොරතුරු සන්නිවේදන පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම | 09% | 0.07 |
| 04 | ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම | 39% | 0.14 |
| 05 | කතරගම,ලුණුගම්වෙහෙර,අම්පාර,පොළොන්නරුව සහ අනුරාධපුර සහාකර අධ්‍යක්ෂ කාර්යාල සඳහා නව පරිගණක ජාලයක් ස්ථාපිත කිරීම. | 100% | 0.66 |
| | **එකතුව** | | **1.40** |

# පරිච්ඡේදය 02

## ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය

### 2.1. ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- රක්ෂිත ප්‍රදේශ සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම සහ සංශෝධනය.
- රක්ෂිත ප්‍රදේශ සඳහා සම්පත් වට්ටෝරු පිළියෙල කිරීම සහ යාවත්කාලීන කිරීම.
- රක්ෂිත ප්‍රදේශ ජාලය විමර්ශනය කිරීම සහ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.
- රක්ෂිත ප්‍රදේශ මායිම් මිනුම් කිරීම සහ සලකුණු කිරීම.
- වනජීවි වාසස්ථාන කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සහ පසුවිපරම් කිරීම.
- ආක්‍රමණශීලි ශාක සඳහා විශේෂ පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම.
- ගිනිපටි සහ වනජීවී වාසස්ථාන වල සංඝටක කළමනාකරණය
- පරිසර දූෂණය පාලනය සහ වනජීවි විශේෂ ආරක්ෂා කිරීමේ සැලසුම් සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය
- රක්ෂිත ප්‍රදේශ තුළ යෝජිත සංවර්ධන කටයුතු සඳහා පරිසර ශක්‍යතා අධ්‍යනය සිදුකිරීම.
- රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා පරිසර ශක්‍යතා අධ්‍යනය කටයුතු වලට සහභාගි වීම.

### 2.2.රක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපිතකිරීම

- රක්ෂිත ප්‍රදේශ ජාලය ශක්තිමත් කිරීම සඳහා එම රක්ෂිත ප්‍රදේශවල මායිම් මිනුම් කිරීම සහ සලකුණු කිරීම සිදුකරන ලදී. ඒ යටතේ 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද මායිම් සලකුණු කිරීමේ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය 2.1 වගුවෙහි දැක්වේ.

**වගුව 2.1 : රක්ෂිත ප්‍රදේශ මායිම් මිනුම් කිරීම හා සලකුණු කිරීම - 2017**

| වනජීවී කලාපය | ක්‍රියාකාරකම් | නිම කරන ලද මායිම්වල මුළු දිග |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | මායිම් මිළදී ගැනිම | කණු 2500 |
| කිලිනොච්චිය | ඩෙල්ෆ් ජාතික උද්‍යානයේ මායිම් සලකුණු කිරීම | කි.මී.06 |
| | චුන්ඩිකුලම්ජාතික උද්‍යානයේ මායිම් සලකුණු කිරීම | කි.මී.17.5 |
| නැගෙනහිර | ලාහුගල ජාතික උද්‍යානයේ මායිම් සලකුණු කිරිම | කි.මී.30 |
| පුත්තලම | කොටු අත්තාවල අභය භූමියේ මායිම් සලකුණු කිරිම | කි.මී.2.4 |
| මධ්‍යම | සමනල ස්වභාව රක්ෂිතයේ දකුණු මායිම් සලකුණු කිරීම | කි.මී.42.5 |
| බස්නාහිර | මාදුගඟ අභය භූමිය මායිම් සලකුණු කිරීම | කි.මී.15 |
| | රත්ගම කලපු අභය භූමිය මායිම් සලකුණු කිරීම | කි.මී.15 |

**වෙන් කල මුදල - රු.මි.12.37**
**වියදම් කල මුදල - රු.මි.10.58**

- රක්ෂිත ප්‍රදේශවල මායිම් වල ජනතාව දැනුවත් කිරිම සඳහා දැන්වීම් පුවරු සකස් කරන ලදී. වගුව 2.2 හි මෙසේ 2017 වර්ෂයේ රක්ෂිත ප්‍රදේශවල ස්ථාපනය කරන ලද දැන්වීම් පුවරු පිළිබඳ තොරතුරු දැක්වේ.

**වගුව 2.2: දැන්වීම් පුවරු ස්ථාපනය හා ප්‍රතිසංස්කරණය කිරීම - 2017**

| වනජීවී කලාපය | අභයභූමිය | ප්‍රමාණය | දැන්වීම් පුවරු සංඛ්‍යාව |
|---|---|---|---|
| කිලිනොච්චිය | චුන්ඩිකුලම් අභයභූමියේ නාම පුවරු සවි කිරිම | 6’ x 4’ – 04<br>4’ x 2’ – 06 | 10 |
| | කෝකිලායි අභයභූමියේ නාම පුවරු සවි කිරිම | 6’ x 4’ – 04<br>4’ x 2’ – 06 | 10 |
| | ඩෙල්ෆ් ජාතික උද්‍යානයේ නාම පුවරු සවි කිරිම | 6’ x 4’ – 03<br>4’ x 2’ – 05 | 08 |
| | වවුනිකුලම් අභයභූමියේ නාම පුවරු සවි කිරිම | 6’ x 4’ – 03<br>4’ x 2’ – 05 | 08 |
| | නාගර් කොවිල් ස්වභාවික රක්ෂිතයේ නාම පුවරු සවි කිරිම | | 01 |
| පොළොන්නරුව | සිගිරිය අභයභූමියේ නාම පුවරු සවිකිරීම | 6’ x 4’ – 06<br>4’ x 2’ – 05 | 11 |
| | ඇළැහැර ගිරිතලේ අභයභූමියේ නාම පුවරු සවිකිරීම | 6’ x 4’-10 | 10 |
| | අංගමැඩිල්ල ජාතික උද්‍යානයේ නාම පුවරු සවිකිරීම | 6’ x 4’-02 | 02 |
| | මින්නේරිය ජාතික උද්‍යානයේ නාම පුවරු සවිකිරීම | 6’ x 4’ – 08<br>4’ x 2’- 08 | 16 |
| | උද්‍යාන මූලස්ථාන පුවරුව භාෂා තුනෙන් අළුතින් සවිකිරීම | | 10 |
| දකුණ | කිරලකැලේ අභයභූමිය නාම පුවරු සකස් කිරිම | 6’ x 4’- 05<br>4’ x 2’– 08 | 13 |
| | වීරවිල අභයභූමිය නාම පුවරු සකස් කිරිම | 6’ x 4’– 10 | 10 |
| වවුනියාව | මඩු ජාතික උද්‍යානයේ නාම පුවරු සකස් කිරිම | 8’ x 4’-01 | 01 |
| | වවුනියාව කාර්යාලයේ නාම පුවරු සකස් කිරිම | | 01 |
| | මන්නාරම කාර්යාලයේ නාම පුවරු සකස් කිරිම | | 01 |
| | මැදවච්චිය දැන්වීම් පුවරු සකස් කිරිම | | 10 |
| මධ්‍යම | රාවණ ඇල්ල අභයභූමියේ නාම පුවරු සකස් කිරිම | 6’ x 4’- 05<br>4’ x 2’– 01 | 06 |
| | සමනළ ස්වාභව රක්ෂිතයේ නාම පුවරු සකස් කිරිම | 6’ x 4’- 08 | 08 |

| වනජීවී කලාපය | අභයභූමිය | ප්‍රමාණය | දැන්වීම් පුවරු සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර | මුතුරාජවෙල අභයභූමිය නාම පුවරු සකස් කිරිම | 6’ x 4’-11 | 11 |
| ඌව | කටගමුව අභයභූමිය නාම පුවරු සකස් කිරිම | 6’ x 4’ – 04<br>4’ x 2’ – 06 | 10 |
| පුත්තලම | පිබිදුණුගම නාම පුවරු සකස් කිරිම | 6’ x 4’-01 | 01 |
| | කොටුඅත්තාවල නාම පුවරු සකස් කිරිම | 5’ x 3’ – 01<br>4’ x 2’ – 02 | 03 |
| | ගල් කිරියාගම නාම පුවරු සකස් කිරිම | 4’ x 2’ – 02 | 02 |
| නැගෙනහිර | ලාහුගල ජාතික උද්‍යානයේ නාම පුවරු සකස් කිරිම | 6’ x 4’ – 07<br>4’ x 2’ – 12 | 19 |
| | මන්මුනේ බිට්ටු කාර්යාලය නාම පුවරු සකස් කිරිම | 5’ x 3’ – 01 | 01 |
| | වෙල්ලවායි බිට්ටු කාර්යාලය නාම පුවරු සකස් කිරිම | 5’ x 3’ – 01 | 01 |
| | කිරන් නාම පුවරු සකස් කිරිම | 5’ x 3’ – 01 | 01 |
| | කුමන ජාතික උද්‍යානයේ නාම පුවරු සකස් කිරිම | | 22 |
| | දමන අඩවියේ දැනුවත් කිරිමේ පුවරු සකස් කිරිම | | 02 |
| | ලාහුගල මහජනතාව දැනුවත් කිරීමේ නාම පුවරු සකස් කිරිම | | 06 |

**වෙන් කල මුදල - රු.මි.7.63**

**වියදම් කල මුදල -රු.මි. 5.17**

## 2.3. වන ජීවීන් සඳහා වාසස්ථාන සුපෝෂණය

වනජීවීන් සඳහා වාසස්ථාන සුපෝෂණය යටතේ තෘණභූමි කළමනාකරණය කිරීම , ආක්‍රමණශීලි ශාක විශේෂ ඉවත් කිරීම,වැව් ප්‍රතිසංස්කරණය හා ඉදි කිරීම්, යටි වගාව ඉවත් කිරීම/ නඩත්තු කිරීම, ගිනිපටි කළමණාකරණය සහ වෙනත් සංවර්ධන කටයුතු යන ක්‍රියාකාරකම් ප්‍රමුඛ වේ. වගු 2.3, 2.4, 2.5 2.6 ,2.7සහ 2.8 මඟින් 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද වාසස්ථාන සුපෝෂණ කටයුතු දැක්වේ.

වගුව 2.3: වනජීවී කලාප වල තෘණභූමි කළමනාකරණය - 2017

| වනජීවී කලාපය | වනජීවී රක්ෂිතය | ප්‍රමාණය |
|---|---|---|
| පොළොන්නරුව | Slasher මගින් තෘණ භූමි කළමනාකරණය- මින්නේරිය ජාතික උද්‍යානය | හෙක්.100 |
| වයඹ | අඹ පැළ සිටවීම | පැළ 350 |
| නැගෙනහිර | තෘණ භූමි කළමනාකරණය -ලාහුගල ජාතික උද්‍යානය | හෙක්.9.5 |
| ඌව | යාල ජාතික උද්‍යානයේ තෘණ භූමි නඩත්තු කිරීම | හෙක්.05 |
| | පාර දෙපස තෘණභූමි නඩත්තු කිරීම - ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය | හෙක් .10 |

**වෙන් කල මුදල -රු.මි. 2.79**
**වියදම් කල මුදල -රු.මි. 1.45**

වගුව 2.4: ආක්‍රමණශීලි ශාක විශේෂ ඉවත් කිරීම - 2017

| වනජීවී කලාපය | වනජීවී රක්ෂිතය | ප්‍රමාණය හෙක්ටයාර |
|---|---|---|
| දකුණ | උඩවලව ජාතික උද්‍යානයේ ලන්ටාන ඉවත් කිරීම | 57.5 |
| | බුන්දල ජාතික උද්‍යානයේ ආක්‍රමණශීලි ශාක ඉවත් කිරීම | 08 |
| | උඩවලව ජාතික උද්‍යානයේ ආක්‍රමණශීලි ශාක ඉවත් කිරීම | 3.5 |
| ඌව | ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ ලැන්ටාන ඉවත් කිරීම | 50 |
| අනුරාධපුරය | හොරොව්පතාන ජාතික උද්‍යානයේ ලැන්ටාන ඉවත් කිරීම | 15 |

**වෙන් කල මුදල - රු.මි.8.64**
**වියදම් කල මුදල - රු.මි.6.48**

වගුව 2.5: ජල මුලාශ්‍ර ප්‍රතිසංස්කරණය හා නව ඉදිකිරීම් - 2017

| වනජීවී කලාපය | රක්ෂිත ප්‍රදේශය | නව ඉදිකිරීම් (සංඛ්‍යාව) | ප්‍රතිසංස්කරණ (සංඛ්‍යාව) | සූර්ය ජල සැපයුම්පද්ධති කටයුතු |
|---|---|---|---|---|
| කිලිනොච්චිය | කිලිනොච්චිය | 01 | | |
| පොළොන්නරුව | මින්නේරිය ජාතික උද්‍යානය | 05 | | |
| | සිගිරිය අභයභූමිය | | 01 | |
| නැගෙනහිර | ලාහුගල ජාතික උද්‍යානය | 05 | | 01 |
| | ගල්ඔය උද්‍යානය | 03 | 03 | |
| ඌව | යාල ජාතික උද්‍යානය | | 01 | |
| | ලුණුගම්වෙහෙර | | 02 | |
| දකුණ | උඩවලව ජාතික උද්‍යානය | 04 | | |
| | බුන්දල ජාතික උද්‍යානය | | 01 | |

| වනජීවී කලාපය | රක්ෂිත ප්‍රදේශය | නව ඉදිකිරීම් (සංඛ්‍යාව) | ප්‍රතිසංස්කරණ (සංඛ්‍යාව) | සූර්ය ජල සැපයුම්පද්ධති කටයුතු |
|---|---|---|---|---|
| අනුරාධපුරය | විල්පත්තුව ජාතික උද්‍යානය | | 01 | |
| | හොරව්පතාන ජාතික උද්‍යානය | | 01 | |
| එකතුව | | 18 | 10 | 01 |

**වෙන් කල මුදල - රු.මි.77.87**
**වියදම් කල මුදල - රු.මි.60.86**

වගුව **2.6:** යටි වගාව ඉවත් කිරීම/යටි වගාව නඩත්තු කිරීම **- 2017**

| වනජීවී කලාපය | රක්ෂිත ප්‍රදේශ | ප්‍රමාණය හෙක්ටයාර |
|---|---|---|
| පොළොන්නරුව | මින්නේරිය ජාතික උද්‍යානයේ යටි වගා ඉවත් කිරීම | 20 |
| දකුණ | උඩවලව ජාතික උද්‍යානයේ යටි වගා ඉවත් කිරීම | 30 |
| නැගෙනහිර | ලාහුගල ජාතික උද්‍යානය යටි වගාව ඉවත් කිරීම | 47 |
| | ගල්ඔය ජාතික උද්‍යානය යටි වගාව ඉවත් කිරීම | 12 |
| ඌව | යාල ජාතික උද්‍යානය යටි වගාව ඉවත් කිරීම | 37.5 |

**වෙන් කල මුදල -රු.මි.4.77**
**වියදම් කල මුදල -රු.මි.4.54**

වගුව **2.7:** ගිනිපටි කළමණාකරනය කිරීම **- 2017**

| වනජීවී කලාපය | රක්ෂිත ප්‍රදේශ | ප්‍රමාණය |
|---|---|---|
| පුත්තලම | ආනවිලුන්දාව අභයභූමිය | අක්කර 05 |

**වෙන් කල මුදල -රු.මි.1.35**
**වියදම් කල මුදල -රු.මි.0.10**

වගුව **2.8:** වෙනත් සංවර්ධන කටයුතු **- 2017**

| වනජීවී කලාපය | රක්ෂිත ප්‍රදේශ | කාර්යය |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | කොළඹ | ලෝක තෙත් බිම් දිනය |
| බස්නාහිර | දොඩන්දූව සමුද්‍රීය සංරක්ෂණ මධ්‍යස්ථානය | කැස්බෑ සංරක්ෂණ කටයුතු සඳහා ටැංකි 2ක් හා බිත්තර රකුම් මධ්‍යස්ථානයක් (Hachary) ඉදිකිරීම |
| අනුරාධපුරය | හොරව්පතාන ජාතික උද්‍යානය | හොරව්පතාන ජාතික උද්‍යානයේ ළිඳක් ඉදි කිරීම |
| ඌව | ලුණුගම්වෙහෙර ජා. උ. | නියං සමයේ ජල සම්පාදන කටයුතු |

**වෙන් කල මුදල -රු.මි.4.58**
**වියදම් කල මුදල -රු.මි.4.12**

**2.4. 2017 වර්ෂයේ සිදු කරන ලද පාරිසරික ඇගයිම් හා මූලික පාරිසරික ඇගයිම් පිළිබඳ තොරතුරු.**

2017වර්ෂය තුල දෙපාර්තමේන්තුව විසින් (ව්‍යාපෘති යෝජක ලෙස ) නිම කරන ලද ව්‍යාපෘති පිළිබඳ තොරතුරු 2.9 වගුව මගින් දැක්වේ.

**වගුව 2.9 පාරිසරික ඇගයිම් හා මූලික පාරිසරික ඇගයිම් පිළිබඳ තොරතුරු-2017**

| ව්‍යාපෘතියේ නම | ප්‍රගතිය |
|---|---|
| යෝජිත මාගල් ගංගා කුඩා ජල විදුලිබලාගාර ව්‍යාපෘතිය | අවසර ලබා දී ඇත. |
| හග්ගල පේරාදේණිය බදුල්ල වෙන්කලාඩි පාරේ නාය යෑම් අවම කිරිම | අවසර ලබා දී ඇත. |
| යෝජිත ගොඩවැලි කැණිම් ව්‍යපෘති | අවසර ලබා දී ඇත. |

**2.5. 2017 වර්ෂයේ ප්‍රකාශයට පත් කළ රක්ෂිත ප්‍රදේශ ජාලය**

**වගුව 2.10. 2017 වර්ෂය් ගැසට් මගින් ප්‍රකාශයට පත්කල රක්ෂිත ප්‍රදේශ ජාලය**

| රක්ෂිත ප්‍රදේශය | ප්‍රකාශිත දිනය |
|---|---|
| • නයාරු ස්වභාව රක්ෂිතය | 2017.01.24 |
| • නන්දිකඩාල් ස්වභාව රක්ෂිතය | 2017.01.24 |
| • කොඩිගහකන්ද අභයභූමිය | 2017.10.03 |
| • කොටුඅත්තාවල අභයභූමිය | 2017.02.23 |

## පරිච්ඡේදය 03

# නීති ක්‍රියාත්මක කිරීම් අංශය

### 3.1. ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත ක්‍රියාත්මක කිරීම හා අදාල රාජකාරී සඳහා දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයට අවශය සහාය ලබාදීම.
- වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ අවශ්‍ය සංශෝධන සිදුකිරීම සහ ඒ යටතේ පනවනු ලබන රෙගුලාසි පිළියෙල කිරීම.
- නීතිපති දෙපාර්තමේන්තුව හා නිතීය ක්‍රියාත්මක කිරිමට ආදාල අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධිකරණ කටයුතු.
- වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ සිදු කළ යුතු ලියාපදිංචි කිරිම් හා බලපත්‍ර නිකුත් කිරිමේ කටයුතු සිදු කිරිම
- CITES සම්මුතිය යටතේ බලපත්‍ර නිකුත් කිරිම.

### 3.2. කාර්යය සාධනයේ විස්තර

### 3.2.1. වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත ක්‍රියාවට නැංවීම

- **ගෘහාශ්‍රිත අලි ඇතුන් සහ දළ ලියාපදිංචි කිරීම.**


ගෘහාශ්‍රිතව තබා ගන්නා අලින් ලියාපදිංචි කිරීම, ඇත්දළ ලියාපදිංචි කිරීම, අලි ඇතුන් සඳහා බලපත්‍ර වාර්ෂිකව අලුත් කිරීම අනිවාර්ය නීතිමය අවශ්‍යතාවකි.

- **වනජීවි අපරාධ විමර්ශනය**


වනජීවි අපරාධ මැඩලීම සඳහා ක්‍රියාකිරීමේදී සාර්ථක වැටලීම්1048ක් සිදුකිරීමට හැකි වූ අතර එම අපරාධකරුවන් උසාවි වෙත ඉදිරිපත් කරන ලදී. උසාවි මගින් වනජීවි අපරාධ සඳහා නියම කරන ලද දඩ මුදල් රු.34,900,400.00 ක මුදලක් වනජීවී සංරක්ෂණ අරමුදලට බැරවී ඇත. 2017 වර්ෂය තුළදී පවරන ලද නඩු සංඛ්‍යාව වගුඅංක 3.1 න්ද වනජීවි අපරාධ වලට උසාවි නියෝග අනුව පනවන ලද දඩමුදල් වලින් 2013 – 2017 දක්වා එක්රැස් කර ගත් ආදායම රූපය 3.2න් ද දැක්වේ.

වගුව 3.1: පවරනලද වනජීවී අපරාධ සම්බන්ධ නඩු සංඛ්‍යාව 2017

| වනජීවී කලාපය | නඩු සංඛ්‍යාව |
|---|---|
| අනුරාධපුරය | 119 |
| මධ්‍යම | 80 |
| නැගෙනහිර | 140 |
| වයඹ | 146 |
| දකුණ | 114 |
| ඌව | 150 |
| බස්නාහිර | 17 |
| පොළොන්නරුව | 183 |
| වවුනියා | 21 |
| කිලිනොච්චිය | 08 |
| ත්‍රිකුණාමලය | 37 |
| වැටලීම් ඒකකය(ප්‍රධාන කාර්යාලය) | 09 |
| පුත්තලම | 24 |
| **2017 සඳහා මුළු එකතුව** | **1,048** |





රූපය 3.1:පවරන ලද නඩු සංඛ්‍යාව (2013- 2017)




**රූපය3.2: උසාවි දඩමුදල් වලින් ලද ආදායම (2013 - 2017)**

### 3.3. ක්ෂේත්‍ර නිලධාරීන්ට ප්‍රසාද දීමනා ගෙවීම

වනජීවී සංරක්ෂණ අරමුදලට බැර කරන ලද උසාවි දඩ මුදල් ප්‍රමාණයෙන් වරදේ ස්වාභාවය අනුව (50% -60%) අඩක් එම වැටලීම් වලට දායක වූ නිලධාරීන්ට පහත රූපය 3.3 පරිදි ප්‍රසාද දීමනාවක් ලෙස ගෙවා ඇත.




**රූපය 3.3 : ප්‍රසාද දීමනා ගෙවීම් (2013-2017)**

## 3.4 වෙනත් කටයුතු

- **අන්තර්ජාතික සම්මුතීන්**

ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති වනජීවී සංරක්ෂණයට අදාල අන්තර් ජාතික සම්මුතින් කීපයක් සඳහා අධිකාරිමය බලය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

1. CITES - සම්මුතිය යනු අන්තර්ජාතිකව රාජ්‍යයන් අතර ඇති කර ගන්නා ගිවිසුමකි. මෙමගින් අන්තරායට ලක්වූ වනජීවී ශාක හා සතුන් විශේෂ යොදාගෙන සිදුකරන අන්තර්ජාතික වෙළදාම යාමනය කිරීම සිදුකරනු ලැබේ. එමගින් එම විශේෂවල ස්වභාවික පැවැත්ම ආරක්ෂා කිරීම සම්මුතියේ ප්‍රධාන පරමාර්ථය වේ.

වගුව **3.2:** නිකුත් කරන ලද ආනයන අපනයන බලපත්‍ර සංඛ්‍යාව **(2012-2017)**

| වසර | නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | | මුළු ආදායම (රු.මිලි.) |
|---|---|---|---|
| | CITIES | FFPO | |
| 2012 | 616 | 132 | 0.491 |
| 2013 | 562 | 127 | 0.418 |
| 2014 | 608 | 119 | 0.761 |
| 2015 | 582 | 92 | 0.723 |
| 2016 | 641 | 54 | 0.540 |
| 2017 | 820 | 97 | 0.590 |

2. CMS (Bonn) සම්මුතියේ ක්‍රියාකාරකම් - මෙමගින් ගොඩබිමින් , මුහුදු මඟින් , පියැඹීම මගින් පර්යටනය කරනු ලබන විශේෂවල ආරක්ෂාව එම විශේෂවල සම්පූර්ණ හැසිරීම් කලාපය තුළ තහවුරු කිරීම අපේක්ෂා කරනු ලැබේ.
   - සමාජිකත්වය පවත්වාගෙන යාම
   - සංචාරක පක්ෂීන් සඳහා නෛතික ආරක්ෂාව පිළිබඳව අන්තර්ජාතික එකඟතාවය ලබා දිම හා ක්‍රියාත්මක කිරිම/මාර්ග උපදේශන සකස් කිරිම
   - මුහුදු කැස්බෑවන් සංරක්ෂණය සහ මුහුදු ක්ෂීරපායින් සංරක්ෂණය වෙනුවෙන් මාර්ග උපදේශන සකස් කිරිම,වැඩමුළු ක්‍රියාත්මක කිරිම සහ අන්තර්ජාතික එකඟත්වය ලබා දිම.

3. රම්සා සම්මුතිය - මෙම සම්මුතිය මගින් සාමාජික රාජ්‍යයන් විසින් තම දේශසීමා තුළ පවතින අන්තර්ජාතික වශයෙන් වැදගත් වන තෙත්බිම් තිරසර භාවිතය හා

සංරක්ෂණය කිරීම මඟින් එම තෙත් බිම්වල සහ ඒවා වාසස්ථාන කර ගන්නා පර්යටන පක්ෂීන් හා වෙනත් වනජීවි විශේෂවල සංරක්ෂණය අපේක්ෂා කෙරේ.

ඒ අනුව අන්තර්ජාතික වශයෙන් සංරක්ෂණය කෙරෙහි ඉතාම වැදගත් වන මෙම සම්මුතීන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ වගකීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව දරන අතර එම සම්මුති වලට අදාල ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ රැස්වීම්, සම්මේලන, වැඩමුළු ආදියටද ක්‍රියාකාරී සහභාගිත්වයක් ලබාදේ.
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ආරක්ෂාව සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශය වෙත වෙන්කර දුන් ප්‍රතිපාදන යොදවා නීතිය ක්‍රියාත්මක කිරීමට ආධාරවන සම්පත් වැඩිදියුණු කරන ලදී. ක්‍රියාකාරී සැලසුම් ගත කාර්යයන් වල ප්‍රගතිය වගු අංක 3.3 හි දැක්වේ.

**වගුව3.3: 2017වසරේ ක්‍රියාකාරී සැලැස්මේ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය**

| අනු අංකය | ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය | මූල්‍යප්‍රගතිය (රු. මිලි.) |
|---|---|---|---|
| 1 | උසාවි කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු පාඨමාලාව -දින 03 | අධිකරණ නිලධාරීන් දැනුවත් කිරිමේ වැඩසටහන් 02 ක් පවත්වා ඇත. | 0.17 |
| 2 | නිදර්ශක හඳුනා ගැනිම | අවසන් කර ඇත | 0.05 |
| 3 | පතොරම් මිලදි ගැනිම | එස්.ජී. බෝර පතොරම් 4,000 ක් හා නො.04 පතොරම් 2,500ක් මිලදි ගෙන ඇත. | 0.61 |
| 4 | නියං සමයේ මුර සංචාර කිරීම(සියළුම කළාප වල) | කළාප කාර්යාල මගින් මුර සංචාර සිදු කර ඇත | 1.14 |
| 5 | ගිනි අවි රදවන ස්ථාපිත කිරිම කිරිම | ගිනිඅවි රදවන 17 ක් සකස් කර කලාප කාර්යාල වලට බෙදා දි ඇත | 1.39 |
| **එකතුව** | | | **3.36** |

# පරිච්ඡේදය 04

## අලි සංරක්ෂණ අංශය

### 4.1. ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- ජාතික අලි සංරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- වනඅලි සම්බන්ධ දත්ත හා තොරතුරු එකතුව කළමනාකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- වනඅලි පිවිසුම් පෙදෙස් හා පිවිසුම් ආරක්ෂාවන පරිදි වනඅලි සංරක්ෂණ ප්‍රදේශ ස්ථාපිත කිරීම.
- වනඅලි හානි සඳහා වන්දි ගෙවීම.
- ජනාවාස තුළට වනඅලින්ගේ පිවිසීම බාධක වන පරිදි විදුලි වැට, ජීවවැට සහ වෙනත් නවීන ක්‍රමවේද මඟින් භෞතික බාධක ස්ථාපිත කිරීම.
- වනඅලි අල්ලා ඉවත් කිරීම.
- වනඅලි පලවා හැරීම් සංවිධානය, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.
- වනඅලි කළමනාකරණ කටයුතු සඳහා අවශ්‍ය වන භාණ්ඩ මිලදී ගැනීම.

### 4.2. කාර්ය සාධනයේ විස්තරය

#### 4.2.1.අලි මිනිස් ගැටුම

භූමි පරිහරණ රටාවේ වෙනස්වීම් සහ භාවිතා කළ හැකි වාසස්ථානවල ගුණාත්මකභාවය පිරිහීම හේතු කොට ගෙන ප්‍රශස්ථ ගුණාත්මකභාවයකින් යුතු වාසස්ථාන අඩුවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වනඅලි ගහනය එහි පැවැත්මට ඇති තීරණාත්මක බාධාවලට මුහුණ දෙමින් සිටී. මේ හේතුව නිසා මිනිසා සමඟ ඇතිවන ගැටුමෙන් පාර්ශව දෙකටම හානිවන අතර මිනිස් මරණ, වනඅලි මරණ, ශාරීරික හානි සහ දේපළවලට සිදුවන හානි මේ අතුරින් ප්‍රමුඛය. වනඅලි මිනිස් ගැටුම නිසා ප්‍රතිපල වනජීවී කලාපීය වනඅලි මරණ, අලි මරණ සඳහා හේතූන්, මිනිස් මරණ, ශාරීරික හානි සහ දේපළ හානි වගුව 4.1, 4.2, 4.3, 4.4,4.5 , සහ 4.6න් දැක්වේ.

වගුව **4.1**: වනජීවී කලාපවල අලි මරණ ව්‍යාප්තිය **2013 - 2017**

| වනජීවී කලාප | වාර්ෂික අලි මරණ | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | **2013** | **2014** | **2015** | **2016** | **2017** | |
| අනුරාධපුර | 49 | 32 | 27 | 42 | 30 | 180 |
| මධ්‍යම | 7 | 8 | 5 | 5 | 4 | 29 |
| නැගෙනහිර | 29 | 49 | 52 | 55 | 56 | 241 |
| වයඹ | 18 | 15 | 15 | 16 | 15 | 79 |
| පොලොන්නරුව | 63 | 57 | 37 | 54 | 47 | 258 |
| දකුණ | 14 | 28 | 12 | 26 | 17 | 97 |
| ඌව | 22 | 16 | 13 | 14 | 25 | 90 |
| ඇත් අතුරු සෙවන | 4 | 12 | 6 | 8 | 7 | 37 |
| කිලිනොච්චි | - | 5 | 4 | 2 | 4 | 15 |
| වවුනියා | - | 9 | 12 | 16 | 13 | 50 |
| ත්‍රිකුණාමලය | - | - | 22 | 30 | 22 | 74 |
| පුත්තලම | - | - | - | 11 | 16 | 27 |
| **එකතුව** | **206** | **231** | **205** | **279** | **256** | **1177** |

වගුව **4.2**:අලි මරණ සඳහා හේතූන් **2017**

| වනජීවී කලාපය | මරණ සඳහා හේතු | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගිනි අවි | විදුලිය වැදීම් | වස දීමෙන් | හක්ක පටස් | දුම්රිය අනතුරු | හඳුනාගත නොහැකි | අනතුරු | සවභාවික | වෙනත් හේතූන් | එකතුව |
| නැගෙනහිර | 12 | 4 | 2 | 18 | 0 | 7 | 3 | 7 | 3 | **56** |
| පොලොන්නරුව | 7 | 4 | 0 | 9 | 2 | 9 | 6 | 2 | 8 | **47** |
| දකුණ | 3 | 1 | 0 | 0 | 0 | 7 | 4 | 2 | 0 | **17** |
| වයඹ | 7 | 2 | 0 | 2 | 1 | 1 | 1 | 1 | 0 | **15** |
| මධ්‍යම | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | **4** |
| ඇත් අතුරු සෙවන | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 7 | 0 | **7** |
| අනුරාධපුරය | 6 | 8 | 1 | 8 | 0 | 2 | 4 | 0 | 1 | **30** |
| වවුනියාව | 4 | 1 | 1 | 4 | 2 | 1 | 0 | 0 | 0 | **13** |
| ඌව | 2 | 1 | 2 | 2 | 0 | 13 | 2 | 1 | 2 | **25** |
| කිලිනොච්චිය | 1 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 0 | **4** |
| ත්‍රිකුණාමලය | 2 | 3 | 0 | 8 | 0 | 8 | 1 | 0 | 0 | **22** |
| පුත්තලම | 5 | 0 | 1 | 1 | 1 | 0 | 4 | 1 | 3 | **16** |
| එකතුව | **50** | **24** | **7** | **54** | **7** | **50** | **25** | **22** | **17** | **256** |

වගුව 4.3: අලි ප්‍රහාර හේතුවෙන් සිදුවූ වාර්ෂික මිනිස් මරණ(2013 – 2017)

| වනජීවී කලාපය | වාර්ෂික මිනිස් මරණ | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | |
| වයඹ | 25 | 7 | 12 | 6 | 5 | **55** |
| පොළොන්නරුව | 12 | 16 | 10 | 26 | 16 | **80** |
| නැගෙනහිර | 18 | 22 | 15 | 20 | 23 | **98** |
| දකුණ | 3 | 9 | 7 | 10 | 10 | **39** |
| මධ්‍යම | 3 | 2 | 4 | 0 | 3 | **12** |
| ඌව | 2 | 4 | 2 | 4 | 7 | **19** |
| අනුරාධපුරය | 7 | 5 | 8 | 13 | 11 | **14** |
| කිලිනොච්චිය | - | 1 | - | 1 | 1 | **3** |
| වවුනියා | - | 1 | 1 | 2 | 3 | **7** |
| ත්‍රිකුණාමලය | - | - | 4 | 4 | 5 | **13** |
| පුත්තලම | | | | 2 | 3 | **5** |
| **එකතුව** | **70** | **67** | **63** | **88** | **87** | **375** |

වගුව 4.4: අලි ප්‍රහාර හේතුවෙන් සිදුවූ වාර්ෂික මිනිස් මරණ වර්ගීකරණය

| වර්ෂය | මරණ සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | පිරිමි (වැඩිහිටි) | ගැහැණු (වැඩිහිටි) | ළමා | එකතුව |
| 2009 | 43 | 7 | 0 | 50 |
| 2010 | 64 | 16 | 1 | 81 |
| 2011 | 50 | 10 | 0 | 60 |
| 2012 | 58 | 13 | 2 | 73 |
| 2013 | 60 | 8 | 2 | 70 |
| 2014 | 54 | 12 | 1 | 67 |
| 2015 | 60 | 3 | 0 | 63 |
| 2016 | 73 | 11 | 4 | 88 |
| 2017 | 79 | 8 | 0 | 87 |
| **එකතුව** | **541** | **88** | **10** | **639** |

වගුව 4.5: දේපළ හානි ව්‍යාප්තිය (2013-2017)

| දිස්ත්‍රික්කය | වාර්ෂික දේපල හානි | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | එකතුව |
| පොළොන්නරුව | 136 | 132 | 226 | 294 | 8 | **796** |
| මාතලේ | 82 | 70 | 49 | 66 | 8 | **275** |
| ත්‍රිකුණාමලය | 35 | 39 | 17 | 66 | 57 | **214** |
| පුත්තලම | 27 | 32 | 31 | 29 | 3 | **122** |
| කුරුණෑගල | 87 | 130 | 133 | 133 | 0 | **483** |
| අනුරාධපුරය | 100 | 106 | 106 | 170 | 4 | **486** |

| දිස්ත්‍රික්කය | වාර්ෂික දේපල හානි | | | | | |
|---|---|---|---|---|---|---|
| | **2013** | **2014** | **2015** | **2016** | **2017** | **එකතුව** |
| බදුල්ල | 119 | 161 | 149 | 146 | 35 | **610** |
| අම්පාර | 199 | 182 | 141 | 294 | 100 | **916** |
| මොණරාගල | 153 | 213 | 137 | 108 | 18 | **629** |
| හම්බන්තොට | 66 | 107 | 55 | 40 | 35 | **303** |
| රත්නපුර | 4 | 0 | 5 | 1 | 1 | **11** |
| නුවරඑළිය | 0 | 8 | 14 | 1 | 0 | **23** |
| මහනුවර | 19 | 4 | 14 | 10 | 15 | **62** |
| වවුනියාව | 1 | 3 | 2 | 3 | 10 | **19** |
| මඩකලපුව | 68 | 92 | 33 | 99 | 27 | **319** |
| මන්නාරම | 0 | 0 | 6 | 0 | 4 | **10** |
| මුලතිවු | 0 | 0 | 2 | 0 | 0 | **2** |
| **එකතුව** | **1096** | **1279** | **1120** | **1460** | ***325** | **5280** |

* තාවකාලික (2016.09.17 දින සිට වනඅලි ඇතුලු ආරක්ෂිත වනසතුන්ගෙන් මහජනතාවට සිදුවන හානි සඳහා වන්දි ගෙවීමේ කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත පවරා ඇති අතර දිස්ත්‍රික් වන්දි කමිටු මගින් දැනට ලබා දී ඇති තොරතුරු මත 2017 වර්ෂයේ හානි සිදුවීම් ප්‍රමාණය දැක්වේ )

**වගුව 4.6: ශාරීරික හානි ව්‍යාප්තිය (2013-2017)**

| දිස්ත්‍රික්කය | වාර්ෂික දේපල හානි | | | | | |
|---|---|---|---|---|---|---|
| | **2013** | **2014** | **2015** | **2016** | **2017** | **එකතුව** |
| පොළොන්නරුව | 8 | 8 | 11 | 5 | 8 | **40** |
| මාතලේ | 0 | 1 | 0 | 0 | 3 | **4** |
| ත්‍රිකුණාමලය | 4 | 4 | 0 | 11 | 2 | **21** |
| පුත්තලම | 5 | 5 | 3 | 4 | 3 | **20** |
| කුරුණෑගල | 5 | 5 | 2 | 2 | 0 | **14** |
| අනුරාධපුරය | 10 | 19 | 12 | 14 | 16 | **71** |
| බදුල්ල | 2 | 4 | 3 | 6 | 0 | **15** |
| අම්පාර | 13 | 15 | 8 | 15 | 5 | **56** |
| මොණරාගල | 5 | 11 | 5 | 5 | 0 | **26** |
| හම්බන්තොට | 3 | 6 | 2 | 3 | 2 | **16** |
| රත්නපුර | 0 | 0 | 2 | 1 | 0 | **3** |
| නුවරඑළිය | 0 | 0 | 0 | 2 | 0 | **2** |
| මහනුවර | 0 | 0 | 2 | 2 | 1 | **5** |
| වවුනියාව | 0 | 1 | 1 | 6 | 2 | **10** |
| මඩකලපුව | 3 | 3 | 4 | 17 | 21 | **48** |
| මාතර | 0 | 0 | 0 | 0 | 1 | **1** |
| යාපනය | 0 | 0 | 0 | 0 | 2 | **2** |
| **එකතුව** | **58** | **82** | **55** | **93** | **66** | **354** |

### 4.2.2. විදුලි වැට ඉදිකිරීම

විදුලි වැට වන අලින්ගේ සංචරණ කටයුතු වලට භෞතික බාධකයක් ලෙස 1966 සිට ශ්‍රී ලංකාව තුළ භාවිතා වේ. අද වන විට වනඅලි මිනිස් ගැටුම මැඩලීම සඳහා යොදාගනු ලබන ප්‍රධානතම මෙවලම වන්නේ විදුලි වැට ඉදිකිරීමයි.

**වගුව 4.7:2017 වර්ෂයේ දී ඉදිකරන ලද නව විදුලි වැටවල්**

| වනජීවී කලාපය | විදුලි වැටේ නම | දිග (කි.මී) |
|---|---|---|
| නැගෙනහිර | තුම්පලච්චොල් විදුලි | 4 |
| | කට්පන සිට කිතුන් | 12.53 |
| | කිතුල් සිට මාර්පලම් | 10 |
| පොලොන්නරුව | පොතුගුල් වෙහෙර පරාක්‍රම සමුද්‍රය | 5 |
| | තිඹලව හිරිවඩුන්න | 12 |
| | සුළුගුනේ ගම වටා | 8 |
| ත්‍රීකුණාමලය | කිවුලේකඩ | 14 |
| | වෙලන්ගස්කඩ මහින්දපුර | 11 |
| | කුඹුරුපිටිය | 6.5 |
| | තෙන්නමරච්චි වාඩිය-අදියර1 | 10 |
| | තෙන්නමරච්චි වාඩිය-අදියර11 | 8.5 |
| | සමගිපුර නීලපොල | 9 |
| අනුරාධපුරය | මාවත වැව නල්ලමුද්‍රාව | 30 |
| | කුකුල්කටුව රනෝරාව | 25 |
| | මෝරගොඩ කොරකහවැව | 6.4 |
| වවුනියාව | ඉලමන්දරම්කුලම් | 8.7 |
| | නන්දිමිත්‍රගම | 8.6 |
| | පරන්තන් | 20.1 |
| | වෙලන්කුලම | 13 |
| | මරතෝඩි | 7.5 |
| ඌව | ආනපල්ලම ජනවාස3 හා 4 | 1.8 |
| | අයිස්පිල්ල ගල්බොක්ක | 10 |
| | කළුවල කුමාරතැන්න | 10 |
| | වෙලන්විට | 6 |
| | මහගොඩයාය | 5 |
| | දියකිරිත්තගම | 6 |
| | ආයකපොල්ල හෙලගම | 4.8 |
| | මහකළුගොල්ල සියඹලාණ්ඩුව | 10 |
| | කහම්බාන කොටියාගල-1 | 10 |
| | කහම්බාන කොටියාගල-11 | 6 |

| වනජීවී කලාපය | විදුලි වැටේ නම | දිග (කි.මී) |
|---|---|---|
| මධ්‍යම | පොප්පිටිය කළුවල -1 | 7 |
| | පොප්පිටිය කළුවල -11 | 2.1 |
| | බත්මැඩිල්ල අමුණ තල්පිටිගල | 3.3 |
| | අළුත්ගම බීජගොවිපල මහියංගණය උළුකම්මල | 11.64 |
| වයඹ (ග්‍රාමීය විදුලි වැට) | ඉහලගම | 4.5 |
| | දෙමටවැව අතුකෝරලයාගම | 13 |
| | මහවැව | 5 |
| | බුල්නෑගොඩ | 6 |
| | නාකුළුගම අඩියාගම | 10 |
| | හුනුගල්ලෑව අගුරුවැල්ල | 10 |
| | හේනේගෙදර කැලෑගම | 13 |
| | මඩදෙනිගම | 10 |
| | දිවුල්ගනේ | 5 |
| | හුලෝගෙදර | 10 |
| | අළුත්වැව | 3 |
| | අත්තනපොල දික්යාය | 7.5 |
| | හදපාන්දෙනිගම -නිවස 20 | 7 |
| දකුණ | රතඹලාගම | 8 |
| | අළුත්ගම් ආර උනාතු වැව -1 | 10 |
| | අළුත්ගම් ආර උනාතු වැව -11 | 8.6 |
| | මීගස්වැව කඳන් වැව | 7 |
| | මහනෙටුගල ඉළුක්පැලැස්ස | 5 |
| | ඇල්ලමෝදර පැලැස්ස | 3 |
| කිලිනොච්චිය | පුදියනගර් | 3.1 |
| | අයියන්කුලම | 16.2 |
| **මුළු එකතුව** | | **488.37** |

### 4.2.3. 2017 වර්ෂය තුළදී අලිවෙඩි බෙදාදීම

වනඅලින් පලවා හැරීම සඳහා විශේෂයෙන් සැලසුම් කරන ලද ගිගුම් වෙඩි සහ සංඥා වෙඩි යන වර්ග දෙකෙන් තොග වශයෙන් මිලදී ගන්නා ලද අලිවෙඩි වනඅලි මිනිස් ගැටුම පවත්නා ප්‍රදේශවල වනජීවී කාර්යාල වෙත ලබාදෙන ලදී. වනඅලි මිනිස් ගැටුමේ බලපෑමට ලක්වූ ගම්වැසියන්ට එම ප්‍රදේශවල වනජීවී කාර්යාලවලින් මෙම වෙඩි ලබාගැනීමට පහසුකම් සපයා ඇත. වාර්ෂිකව මිළදීගත් අලිවෙඩි සංඛ්‍යාවන් වගුව 4.8 න්ද ඒවා බෙදාදුන් ආකාරය වගුව 4.9 න්ද නිරූපණය කෙරේ.

වගුව **4.8:** ගිගුම් වෙඩි සහ සංඥා වෙඩි මිලදී ගැනීම **- 2017**

| වර්ගය | මිලදී ගත් සංඛ්‍යාව | වියදම (රු.) |
|---|---|---|
| ගිගුම් වෙඩි (ලොකු) | 360,000 | 27,609,194.25 |
| ගිගුම් වෙඩි (කුඩා) | 150,000 | 10,023,200.00 |
| සංඥා වෙඩි | 225,000 | 31,628,772.00 |
| **එකතුව** | 735,000 | 69,261,166.25 |

වගුව **4.9:** ගිගුම් වෙඩි සහ සංඥා වෙඩි බෙදාහැරීම **- 2017**

| වනජීවී කලාපය | ගිගුම් වෙඩි | | සංඥා වෙඩි(සංඛ්‍යාව) |
|---|---|---|---|
| | කුඩා(සංඛ්‍යාව) | ලොකු(සංඛ්‍යාව) | |
| අනුරාධපුර | 42,900 | 21,310 | 34,500 |
| මධ්‍යම | 27,680 | 13,200 | 14,750 |
| නැගෙනහිර | 66,480 | 10,020 | 38,100 |
| වයඹ | 34,630 | 18,000 | 22,950 |
| පොලොන්නරුව | 54,540 | 6,200 | 31,900 |
| දකුණ | 33,050 | 20,025 | 16,150 |
| ඌව | 38,200 | 21,700 | 24,020 |
| වවුනියාව | 9,400 | 6,325 | 6,470 |
| කිලිනොච්චිය | 7,700 | 5,320 | 2,850 |
| ත්‍රිකුණාමලය | 18,200 | 14,800 | 9,600 |
| පුත්තලම | 27,020 | 13,100 | 23,650 |
| වැටලිම් අංශය | 110 | 0 | 60 |
| එකතුව | **359,910** | **150,000** | **225,000** |

### 4.2.4. වන අලි හානි සඳහා වන්දි ගෙවීමේ වැඩසටහන

වන අලින්ගෙන් සිදුවන ආර්ථික හානි ප්‍රතිපූර්ණය කරගැනීමට සහ ජීවිතහානි නිසා පීඩාවට පත්වන්නන්ගේ පවුලේ සාමාජිකයන්ට සහනයක් වශයෙන් වන්දි ගෙවීම අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන ලද ක්‍රමවේදයක් අනුව සිදුකරනු ලැබේ. 2017 වර්ෂය තුළදී වන්දි ගෙවීම් පිළිබඳ තොරතුරු සහ වන අලි හානි වන්දි ගෙවිම සඳහා අනුමත වන්දි ගෙවිමේ උපරිම සිමාවන් වෙනස් විම වගු අංක 4.10 හා වගු 4.11හි දැක්වේ.

වගුව 4.10: වනඅලි හානි වන්දි ගෙවීම සඳහා අනුමත වන්දි ගෙවීමේ උපරිම සීමාවන් වෙනස් වීම

| හානියේ ස්වභාවය | ආමත්‍ය මණ්ඩල සංදේශ අංක **025/2004** වන්දි ක්‍රමය **(2016.09.17** ට පෙර**)** | ආමත්‍ය මණ්ඩල සංදේශ අංක **023/2016** වන්දි ක්‍රමය **(2016.09.17** පසු**)** | ආමත්‍ය මණ්ඩල සංදේශ අංක **05/2017**වන්දි ක්‍රමය **(2017.02.21** ට පසු**)** |
|---|---|---|---|
| මිනිස් මරණ | රු. 100,000.00 | රු. .200,000.00 | රු.500,000.00 |
| ශාරීරික හානි<br>• පූර්ණ<br>• අර්ධ | උපරිම<br>රු.. 100,000.00<br>රු.. 30,000.00 | උපරිම<br>රු.. 200,000.00<br>රු.. 75,000.00 | උපරිම<br>රු. 500,000.00<br>රු. 75,000.00 |
| දේපළ හානි | උපරිම<br>රු.. 50,000.00 | උපරිම<br>රු.. 100,000.00 | උපරිම<br>රු. 100,000.00 |

වගුව 4.11: වනඅලි හානි වන්දි ගෙවීම 2017

| දිස්ත්‍රික්කය | මරණ | | ශාරීරික හානි | | දේපළ හානි | |
|---|---|---|---|---|---|---|
| | ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව | ගෙවන ලද වන්දි මුදල (රු.) | ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව | ගෙවන ලද වන්දි මුදල (රු.) | ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව | ගෙවන ලද වන්දි මුදල (රු.) |
| බදුල්ල | 5 | 1,420,000.00 | 1 | 3,481.00 | 117 | 4,963,190.00 |
| මොනරාගල | 9 | 1,330,000.00 | 3 | 0.00 | 32 | 587,360.00 |
| අනුරාධපුරය | 19 | 1,100,000.00 | 20 | 1,180,114.50 | 86 | 2,225,180.00 |
| අම්පාර | 16 | 5,350,000.00 | 10 | 242,316.00 | 269 | 4,688,525.00 |
| පොළොන්නරුව | 8 | 330,000.00 | 4 | 0.00 | 168 | 3,274,692.00 |
| කුරුණෑගල | 1 | 400,000.00 | 2 | 49,400.00 | 19 | 927,366.00 |
| මඩකලපුව | 9 | 180,000.00 | 21 | 451,000.00 | 51 | 1,140,115.00 |
| මාතලේ | 2 | 230,000.00 | 2 | 43,250.00 | 38 | 1,496,282.00 |
| හම්බන්තොට | 4 | 180,000.00 | 2 | 200,000.00 | 46 | 1,562,215.00 |
| පුත්තලම | 4 | 815,000.00 | 5 | 103,460.00 | 16 | 584,358.00 |
| රත්නපුරය | 0 | 0.00 | 1 | 15,560.00 | 0 | 43,265.00 |
| වවුනියාව | 1 | 50,000.00 | 5 | 137,250.00 | 13 | 227,500.00 |
| මහනුවර | 0 | 0.00 | 1 | 43,000.00 | 59 | 654,600.00 |
| ත්‍රිකුණාමලය | 7 | 1,170,000.00 | 3 | 551,000.00 | 85 | 3,141,785.00 |
| මාතර | 0 | 0.00 | 1 | 325,000.00 | 0 | 0.00 |
| මන්නාරම | 1 | 50,000.00 | 0 | 0.00 | 4 | 0.00 |
| යාපනය | 1 | 500,000.00 | 2 | 45,950.00 | 0 | 0.00 |
| එකතුව | **87** | **13,105,000.00** | **83** | **3,390,781.50** | **1003** | **25,516,433.00** |

### 4.2.5. කරදරකාරී වනඅලින් අල්ලා ඉවත් කිරීම - 2017

වගුව 4.12: කරදරකාරී වන අලින් අල්ලා ඉවත් කිරීම– 2017

| වනජීවී කලාපය | අල්ලාගත් අලින් සංඛ්‍යාව | වියදම (රු.) |
|---|---|---|
| අනුරාධපුර | 2 | 584,863.70 |
| පොලොන්නරුව | 1 | 478,611.00 |
| දකුණ | 9 | 2,002,239.20 |
| වයඹ | 2 | 395,268.41 |
| නැගෙනහිර | 1 | 315,065.00 |
| ඌව | 1 | 168,000.00 |
| පුත්තලම | 1 | 248,219.50 |
| **එකතුව** | **17** | **4,192,266.81** |

### 4.2.6. වන අලි පලවා හැරීම - 2017

වනඅලි මිනිස් ගැටුම පවතිනා ප්‍රදේශ වලින් එම අලින් රක්ෂිත ප්‍රදේශයන් තුළට පළවා හැරීම සිදුකෙරේ. 2017 වර්ෂය තුළ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සංවිධානාත්මක වනඅලි පළවා හැරීම් 09ක් සිදුකර ඇත. එම වනඅලි පළවා හැරීම් පිළිබඳව තොරතුරු වගුව 4.13 දැක්වේ.

වගුව 4.13: වන අලි පලවා හැරීම – 2017

| වනජීවී කලාපය | වන අලි පලවා හැරීම් සංඛ්‍යාව |
|---|---|
| වයඹ | 01 |
| දකුණ | 01 |
| පුත්තලම | 01 |
| මධ්‍යම | 02 |
| පොලොන්නරුව | 02 |
| අනුරාධපුරය | 02 |
| **එකතුව** | **09** |

### 4.3 වන අලි මිනිස් ගැටුම අවම කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග

වගුව 4.14: ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය -2017

| අනු අංකය | ක්‍රියාකාරකම් | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.) |
|---|---|---|
| 01 | විදුලි වැට උපකරණ මිළදී ගැනීම | 140.21 |
| 02 | නිර්වින්දන උපකරණ මිළදී ගැනීම | 17.84 |
| 03 | විදුලි වැට කණු මිළදී ගැනීම | 11.49 |
| 04 | විදුලි වැට නඩත්තු කිරීමේ කටයුතු | 96.10 |

| අනු අංකය | **ක්‍රියාකාරකම්** | **මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)** |
|---|---|---|
| 05 | කන්ටේනර් පෙට්ටි මිළදී ගැනිම | 6.67 |
| 06 | විදුලි වැට ඉදි කිරිම් | 2.94 |
| 07 | වනජීවි පාලන ඒකක පිහිටවිම | 29.30 |
| 08 | වන අලි සඳහා GPS කරපටි පැළඳවිම | 0.34 |
| | **එකතුව** | **304.89** |

# පරිච්ඡේදය 05

## පර්යේෂණ හා පුහුණු අංශය

### 5.1 ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුහුණු හා පර්යේෂණ අවශ්‍යතා හඳුනාගන එම අවශ්‍යතාවයන්ට අනුව පර්යේෂණ හා පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරිම.
- විවිධ බාහිර පාර්ශවයන් සිදුකරන පර්යේෂණවලට අදාළ උපදෙස් සහ අනුමැතිය ලබාදීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය පුස්තකාලය පවත්වාගෙන යාම.
- විදේශීය පුහුණු හා සම්මන්ත්‍රණ වැඩසටහන් සඳහා නිලධාරීන් යොමුකිරීමට කටයුතු කිරීම.
- පාසල් සිසුන්,රාජ්‍ය නිලධාරීන් සහ ග්‍රාමීය ජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රදර්ශන වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම.
- ජාතික වනජීවී පුහුණු කේන්ද්‍රයේ කටයුතු අධීක්ෂණය කර එම කටයුතු පවත්වාගන යාම.
- දෙපාර්තමේන්තු ප්‍රචාරක සහ මාධ්‍ය වැඩසටහන් සැලසුම් කිරිම හා ක්‍රියාත්මක කිරිම.

### 5.2.පර්යේෂණ කටයුතු

වනජීවී සංරක්ෂණ කටයුතුවලට අදාළව පර්යේෂණ අවශ්‍යතා හඳුනාගෙන කෙටි කාලීන පර්යේෂණ ව්‍යාපෘති සිදුකිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනු ලැබේ. එම පර්යේෂණවල ප්‍රතිඵල වනජීවී සංරක්ෂණ හා කළමණාකරණ කටයුතු සඳහා දායක කරගැනීම සිදු වේ.

එයට අමතරව රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ හෝ ඉන් පිටත පර්යේෂණ සිදුකිරීම සඳහා බාහිර ආයතනවලින් පැමිණෙන පර්යේෂකයන් විසින් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ යෝජනා දෙපාර්තමේන්තු පර්යේෂණ කමිටුව වෙත යොමුකර එහි නිර්දේශය මත අවශ්‍ය අනුමැතිය ලබාදීමද සිදු කරනු ලැබේ.

2017 වර්ෂයේදී සිදු කරන ලද පර්යේෂණවලට අදාළ තොරතුරු 5.1 සහ 5.2 වගුවෙන් දැක්වේ.

**වගුව 5.1: වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදු කරන ලද අනුමත පර්යේෂණ අධ්‍යනයන් - 2017**

| අනු අංකය | පර්යේෂණ මාතෘකාව |
|---|---|
| 1 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අලි ඇතුන්ගේ අනන්‍යතාවය DNA තාක්ෂණය මගින් සොයා බැලීම |
| 2 | වන අලින්ගේ හර්පිස් වෛරස් රෝගය පැතිරී යාම සම්බන්ධව අධ්‍යනය |
| 3 | උඩවලව හා බුන්දල ජාතික උද්‍යානයේ GIS සහ Remote Sensing භාවිතයේ වාසස්ථාන සිතියම්ගත කිරීම සහ එම වාසස්ථාන කාලයත් සමග වෙනස් වීම අධ්‍යනය කිරීම. |
| 4 | රුමස්සල අභයභූමියේ ඖෂධීය ශාක සහ වන බෝග දර්ශ පිළිබඳ අධ්‍යනය කිරීම. |
| 5 | යාල ජාතික උද්‍යානයේ (කළාප අංක 01) දළ ඇතුන් පිළිබඳ සමීක්ෂණය. |
| 6 | හොරව්පතාන ජාතික උද්‍යානයේ අල්ලා මුදා හරින ලද මුරණ්ඩු වන අලින්ගේ පිළිබඳ අධ්‍යනය කිරීම. |
| 7 | ඩෙල්ෆ්ට් ජාතික උද්‍යානය වාසභූමි කරගත් කැළෑ අශ්වයින් සමීක්ෂණය තුළින් අශ්ව ප්‍රජාව සංරක්ෂණය කිරීම. |
| 8 | ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය පරිශ්‍රය තුළ හා අවට ප්‍රදේශයේ කළු වඳුරන්ගේ හැසිරීම් රටා හා වෙනස් ආහාර රටාවන් පිළිබඳ අධ්‍යනය කිරීම . |
| 9 | වෙඩිතලතිව් ස්වභාවික රක්ෂිතය ආශ්‍රිතව පවතින වැදගත් සංචාරක ප්‍රදේශ පිළිබඳ සොයා බැලීම. |
| 10 | රක්ෂිත ප්‍රදේශ වල සිටින වන අලින් කෘතිම ලුණු වලට ආකර්ශණය පිළිබඳ අධ්‍යනය කිරීම . |
| 11 | උඩවලව වනෝද්‍යානයේ ගැවසෙන හරකුන්ගේ ගහන ගණත්වය අධ්‍යයනය කිරීම සහ එම සතුන්ගෙන් ස්වභාවික පරිසරයට සිදුවන බලපෑම අධ්‍යනය කිරීම . |

**වගුව 5.2: සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් - 2017**

| අනු අංකය | පර්යේෂණ මාතෘකාව | සම්බන්ධීකරණ ආයතන |
|---|---|---|
| 01 | ජාතික පක්ෂී මුදු පැළඳවීමේ වැඩසටහන - බුන්දල ජාතික උද්‍යානය | කොළඹ විශ්ව විද්‍යාලයේ සත්ව විද්‍යා කවය සමඟ සම්බන්ධව සිදු කර ඇත. |

මෙම පර්යේෂණ ව්‍යාපෘතිවල නිර්දේශයන් දෙපාර්තමේන්තු වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා යොදා ගනු ලැබේ.

## 5.3. පුහුණු කටයුතු

a. කෙටිකාලීන විශේෂ පුහුණු වැඩසටහන්

b. නිත්‍ය පුහුණු වැඩසටහන්

c. විදේශ අධ්‍යයන,සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන්

**a. කෙටිකාලීන පුහුණු වැඩසටහන්**

මෙම කෙටිකාලීන පුහුණු වැඩසටහන් වල මූලික අරමුණ වන්නේ කාර්යමණ්ඩලයේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. මෙම සෑම වැඩසටහනක්ම පාහේ තෝරා ගන්නා ලද පුහුණු කිරීම් ආයතන හෝ සංවිධාන සමඟ ඒකාබද්ධව සිදුකෙරේ. 2017 වර්ෂය තුළදී පවත්වන ලද එවැනි වැඩසටහන් වල විස්තරයක් වගුව 5.3 හා 5.4 වගුව හි දැක්වේ.

**වගුව 5.3: 2017 වර්ෂය තුළ පවත්වන ලද වනජීවී නිලධාරීන් සඳහා කෙටිකාලීන විශේෂ පුහුණු වැඩසටහන්**

| අනු අංකය | පුහුණු වැඩසටහනේ මාතෘකාව | සහභාගී වූ සංඛ්‍යාව | වියදම (රු.මි.) |
|---|---|---|---|
| 01 | වනජීවී පශු වෛද්‍ය නිලධාරීන් සඳහා වනසතුන්ගේ ශල්‍ය කර්ම පිළිබඳ පුහුණු වැඩමුළුව | නිලධාරීන් 15 | 0.14 |
| 02 | බංගලා භාරකරුවන් සඳහා පුහුණු වැඩමුළුව | නිලධාරීන් 102 | 0.26 |
| 03 | නවක අඩවි ආරක්ෂක නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | නිලධාරීන් 80 | 0.47 |
| 04 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන | නිලධාරීන් 80 | 0.93 |
| 05 | කළමණාකරණ සහකාර නිලදාරීන් සඳහා කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන | නිලධාරීන් 25 | 0.08 |
| 06 | මිණුම් උපකරණ භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන | නිලධාරීන් 19 | 0.06 |
| 07 | ගිණි අවි පරිහරණය පිළිබඳ පුහුණු වැඩසටහන | නිලධාරීන් 52 | 0.67 |
| 08 | උසාවි කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | නිලධාරීන් 35 | 0.21 |
| 09 | ඵලදායිතා සංවර්ධන පුහුණු වැඩසටහන | නිලධාරීන් 95 | 0.04 |
| 10 | දෙපාර්තමේන්තු විෂය පථයට අදාළ වෙනත් පුහුණු වැඩසටහන් | නිලධාරීන් 02 | 0.03 |
| | **මුළු වියදම** | | 2.89 |

**වගුව 5.4: 2017 වර්ෂය තුළ බාහිර ආයතන මගින් හා වෙනත් ව්‍යාපෘති වලින් ලද ප්‍රතිපාදන යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන්**

| අනු අංකය | පුහුණු වැඩසටහනේ මාතෘකාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන | නිලධාරීන් 35 |

**b. නිත්‍ය පුහුණු වැඩසටහන්**

ගිරිතලේ පිහිටි වනජීවී පුහුණු කේන්ද්‍රය විසින් වනජිවි සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා නිත්‍ය පුහුණු පාඨමාලා පවත්වනු ලැබේ. 2017 වර්ෂය තුළදී පවත්වන ලද නිත්‍ය පුහුණු පාඨමාලාවල විස්තරයක් වගුව 5.5 හි දැක්වේ.

වගුව **5.5: 2017** වසරේ ජාතික වනජීවී පුහුණු කේන්ද්‍රය පවත්වන ලද නිත්‍ය පුහුණු වැඩසටහන්

| අනු අංකය | පුහුණු පාඨමාලා | වැඩසටහන් සංඛ්‍යාව | භෞතික ඉලක්කය | වියදම (රු. මිලි.) |
|---|---|---|---|---|
| 01 | අඩවි සහකාර නිලධාරීන් සඳහා වනජීවී කළමණාකරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර පාඨමාලාව | 02 | නිලධාරීන් 56ක් පුහුණු කර ඇත. | 3.06 |
| 02. | අඩවි ආරක්ෂක නිලධාරීන්ගේ වනජීවී කළමණාකරණය පිළිබඳ විශේෂ ඩිප්ලෝමා පිළිබඳ පාඨමාලාව | 01 | නිලධාරීන් 27ක් පුහුණු කර ඇත | 3.26 |
| 03 | සේවා ආරම්භක පුහුණු පාඨමාලාව | 02 | නිලධාරීන් 33ක් පුහුණු කර ඇත | 2.22 |
| එකතුව | | | | 8.54 |

**c. විදේශ අධ්‍යයන,සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන්**

2017 වසරේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව නිලධාරීන් ජාත්‍යන්තර මට්ටමේ රැස්වීම්,වැඩමුළු සඳහා සහාභාගි වී ඇති අතර මීට අමතරව ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහාද නිලධාරීන් යොමු කර ඇත.

වගුව **5.6: 2017** වර්ෂය තුළ වනජීවී නිලධාරීන් සහභාගි වූ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් හා රැස්වීම්

| අනු අංකය | රැස්වීම / වැඩමුළුව / පුහුණු වැඩසටහන | රට | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | Meeting of Asian Elephant Range states Government Representatives | ඉන්දුනිසියාව | 02 |
| 02 | The 02nd APAP Workshop on Collaborative Management of Protected Areas | ජාපනය | 01 |
| 03 | High Level United Nations Conference to Support the Implementation of SDG 14: Conserve and Sustainably Use the Oceans , Seas & Marine Resources for Sustainable Development | ඇමරිකා එක්සත් ජනපදය | 01 |
| 04 | Regional Symposium on Sustainable Urban Wetlands | කාම්බෝජය | 01 |
| 05 | Dugongs & Sea Grass Technical Workshop - 2017 | ඩුබායි | 02 |
| 06 | APAP Technical Workshop on Human –Wildlife Conflict | බූතාන | 01 |
| 07 | CITES Tortoises and Freshwater Turtles Task Force Meeting | සිංගප්පූරුව | 02 |

| අනු අංකය | රැස්වීම / වැඩමුළුව / පුහුණු වැඩසටහන | රට | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 08 | Third Executive Committee Meeting of SAWEN and a Workshop | නේපාලය | 01 |
| 09 | 12th Meeting of the Conference of the Parties to the Conservation of Migratory Species of Wild Animals | පිලිපිනය | 01 |
| 10 | CMS COP12 Regional Preparatory Workshop for Asia | ජර්මනිය | 01 |
| 11 | Workshop on World Marine Protected Areas Including Coastal & Marine World | ඉන්දියාව | 01 |
| 12 | 69th Meeting Committee of CITES | ස්විස්ටර්ලන්ත ය | 01 |
| 13 | Study Tour Programme on Wild life Management for Range Assistants - India | ඉන්දියාව | 28 |
| 14 | Seminar on Forest Project Development Along the Belt and road initiatives for Developing Countries – China | චිනය | 10 |
| 15 | Seminar on CITES Implementation and Wildlife Conservation for Developing Countries –China | චිනය | 50 |
| 16 | Seminar on Asia CITES Implementation and Wildlife Conservation for Developing Countries - China | චිනය | 11 |
| 17 | Seminar on Biodiversity Protection and Nature Reserve Management For Development Countries –China | චිනය | 09 |
| 18 | Seminar on the Implementation of Non Legally binding instrument on all types of Forest and Sustainable Forest Management - China | චිනය | 10 |
| 19 | Second Country Study Visit of the Master of Public Management (MPM) Programme - 2016 | චිනය | 01 |
| 20 | 09th Regional Training Workshop for Wetland Managers in South , East and Southeast Asia | කොරියාව | 02 |
| 21 | Gallagher Animal management Asia – 2017 Conference & Training Programme | තායිලන්තය | 02 |
| 22 | International Wetland Training Workshop | චිනය | 01 |
| 23 | Regional Workshop Training of OIE National Focal Points for Wildlife | ඉන්දුනිසියාව | 01 |
| 24 | Development Administration Modernization & Transformation Training Programme Course | මැලේසියාව | 01 |

## 5.4. ව්‍යාප්ති, අධ්‍යාපන හා විවරණ කටයුතු

වනජීවී සම්පත් සංරක්ෂණය සඳහා බාහිර පාර්ශවයන්ගේ දායකත්වය ලබා ගැනීම ඉතා වැදගත් වේ. ඒ සඳහා පාසැල් ළමුන් , ග්‍රාමීය ජනතාව සහ රජයේ නිලධාරීන් යන

ඉලක්කගත කණ්ඩායම් සඳහා ව්‍යාප්ති , අධ්‍යාපන සහ විවරණ වැඩසටහන් පවත්වන අතර එම ක්‍රමවේදය සංරක්ෂණ කටයුතු සඳහා යොදාගත හැකි ඉතා හොඳ උපාය මාර්ගයකි.

**වගුව 5.7: 2017 වසරේ පවත්වන ලද සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ දැනුවත්කිරීමේ වැඩසටහන්**

| අනු අංකය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|
| 1 | ලෝක තෙත් බිම් දිනය සනිටුහන් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | වැඩසටහන් 04ක් පවත්වා ඇත. සිසුන්120 ක් දැනුවත් කර ඇත | 0.14 |
| 2 | ලෝක වනජීවී දිනය සනිටුහන් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | වැඩසටහන් 05ක් පවත්වා ඇත. සිසුන් 150ක් දැනුවත් කර ඇත | 0.16 |
| 3 | ලෝක ජෛව විවිධත්ව දිනය සැමරීම | වැඩසටහන් 03ක් පවත්වා ඇත. සිසුන් 108 ක් දැනුවත් කර ඇත | 0.10 |
| 4 | පරිසර දිනය සැමරීම | වැඩසටහන් 05ක් පවත්වා ඇත. සිසුන් 150 ක් දැනුවත් කර ඇත | 0.22 |
| 5 | පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් 35ක් පවත්වා ඇත. සිසුන් 900ක් දැනුවත් කර ඇත | 0.47 |
| 6 | රාජ්‍ය නිලධාරීන් ඇනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් 46 ක් පවත්වා ඇත. නිලධාරින් 2,020 ක් දැනුවත් කර ඇත | 3.00 |
| 7 | විශේෂ දැනුවත්කිරීමේ වැඩසටහන් සහ ප්‍රදර්ශන පැවැත්වීම. | වැඩසටහන් 18 ක් පවත්වා ඇත. | 0.57 |
| 8 | මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | පොසොන් , ඇසල උත්සවයට. | 0.08 |
| **එකතුව** | | | **4.74** |

## 5.5. දෙපාර්තමේන්තු ප්‍රකාශන හා ප්‍රචාරක වැඩසටහන්

පහත දැක්වෙන ප්‍රකාශ (වගුව 5.8 හා 5.9) 2017 වර්ෂයේදී මුද්‍රණය කරන ලද අතර එම ප්‍රකාශන විකිණීම සඳහා ජාතික උද්‍යාන කාර්යාල වෙත නිකුත් කරන ලදි.

**වගුව 5.8: 2017 වසරේ මුද්‍රිත ප්‍රකාශන -දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ**

| ප්‍රකාශණ වර්ගය | පිටපත් සංඛ්‍යාව | වියදම*(රු. මිලියන)* |
|---|---|---|
| වනජීවී සම්පත් සුරැකිම සම්බන්ධ තොරතුරු පත්‍රිකා | 10,000 | 0.53 |

**වගුව 5.9: 2017 වසරේ මුද්‍රිත ප්‍රකාශන -බාහිර ආයතන වලින් ලද ප්‍රතිපාදන යටතේ**

| ප්‍රකාශණ වර්ගය | පිටපත් සංඛ්‍යාව |
|---|---|
| වැලිපර අභයභූමි පිළිබඳ පත්‍රිකා | 5,000 |
| වැලිපර අභයභූමි පිළිබඳ පෝස්ටර් | 10,000 |

2017 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව මගින් සොබාධාර රූපවාහිණී ප්‍රචාරත්මක වැඩසටහනක් ආරම්භ කර ඇති අතර මීට අමතරව විවිධ මාධ්‍ය හරහා ප්‍රචාරත්මක වැඩසටහන් පවත්වා ඇත.

**වගුව 5.10: 2017 වර්ෂයේ මාධ්‍ය ක්‍රියාකාරකම්**

| මාධ්‍ය ක්‍රියාකාරකම් | පිටපත් සංඛ්‍යාව/වැඩසටහන්/වෙළු ම | වියදම (රු. මිලියන) |
|---|---|---|
| වනන්තරේ කතන්දරේ ගුවන් විදුලි වැඩසටහන | වැඩසටහන් 52 ක් පවත්වා ඇත | 0.08 |
| දිණමිණ පුවත්පතේ "වනදිවිය" මාසික අතිරේකය | අතිරේක 12ක් ප්‍රකාශයට පත් කර ඇත | 1.25 |
| රූපවාහිණී වාර්තාමය වැඩසටහන | වැඩසටහන් 11 ක් පවත්වා ඇත | 0.30 |
| Kingdom of Wildlife විඩියෝ පට පිටපත් කිරිම | පිටපත් 50 | 0.03 |
| නයාරු නන්දිකඩාල් කෙටි විඩියෝ පට නිශ්පාදනය කිරිම | පිටපත් 04 | 0.02 |
| සොබාධාර රූපවාහිනී වාර්තාමය වැඩ සටහන් | වැඩසටහන් 50 ක් පවත්වා ඇත | 23.63 |
| **එකතුව** | | **25.31** |

# පරිච්ඡේදය 06

# සංචාරක සේවා කළමණාකරන පාරිසරික සංචාරක හා ජනවිහිදුම්කරණ අංශය

## 6.1. ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- සංචාරක සේවා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම.
- නව සංචාරක පැකේජ හදුන්වාදීම.
- සංචාරක කටයුතු විවිධාංගීකරණය
- සංචාරක සේවා සහ පාරිසරික සංචාරක කටයුතු අලෙවිකරණය සහ ප්‍රවර්ධනය
- රක්ෂිත ප්‍රදේශ තුළ සහ ඒ ආශ්‍රිතව සංචාරක සේවා තොරතුරු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- රක්ෂිත ප්‍රදේශ මත අවට ප්‍රජාවගේ යැපීම අඩු කිරීම සඳහා එම ප්‍රජාවන් රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සඳහා දායක කර ගැනීම.
- අධ්‍යාපනික සහ ව්‍යාප්ති වැඩසටහන් මගින් මහජනතාව සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම.

## 6.2. කාර්යය සාධනයේ විස්තර


### 6.2.1. සංචාරකයින් සහ ආදායම

වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව ජාතික උද්‍යාන ආශ්‍රිතව සපයනු ලබන සංචාරක සේවා මගින් එහි ආදායමින් වැඩි කොටසක් උපයයි. 2017 වර්ෂයේදී වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව සංචාරක සේවා මගින් උපයන ලද මුදල රු. මිලියන 2644.77(වගුව 6.1)

**වගුව 6.1: සංචාරක සේවාවන්හි වාර්ෂික ආදායම - 2017**

| අනු අංකය | උද්‍යාන සහ වෙනත් ස්ථාන | ආදායම (රු.මිලියන) |
|---|---|---|
| 1 | යාල ජාතික උද්‍යානය | 889.10 |
| 2 | හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය | 404.92 |
| 3 | උඩවලව ජාතික උද්‍යානය | 500.00 |
| 4 | වස්ගමුව ජාතික උද්‍යානය | 11.40 |
| 5 | මින්නේරිය ජාතික උද්‍යානය | 288.10 |
| 6 | බූන්දල ජාතික උද්‍යානය | 25.30 |
| 7 | හොරගොල්ල ජාතික උද්‍යානය | 0.27 |
| 8 | කවුඩුල්ල ජාතික උද්‍යානය | 270.50 |
| 9 | ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය | 9.80 |
| 10 | ගල්ඔය ජාතික උද්‍යානය | 10.32 |


| අනු අංකය | උද්‍යාන සහ වෙනත් ස්ථාන | ආදායම (රු.මිලියන) |
|---|---|---|
| 11 | කුමන ජාතික උද්‍යානය | 22.40 |
| 12 | අංගම්මැඩිල්ල ජාතික උද්‍යානය | 0.80 |
| 13 | ගැල්වේස්ලෑන්ඩ් ජාතික උද්‍යානය | 0.81 |
| 14 | විල්පත්තු ජාතික උද්‍යානය | 99.60 |
| 15 | මාදුරුඔය ජාතික උද්‍යානය | 1.70 |
| 16 | ලාහුගල ජාතික උද්‍යානය | 0.80 |
| 17 | පරෙවිදූපත ජාතික උද්‍යානය | 58.00 |
| 18 | හික්කඩුව ජාතික උද්‍යානය | 0.20 |
| 19 | ඇත්අතුරු සෙවණ | 43.00 |
| 20 | කලාවැව ජාතික උද්‍යානය | 0.20 |
| 21 | කොරල්පර අභය භූමිය- කල්පිටිය | 7.00 |
| 22 | කතරගම කාර්යමණ්ඩල සංචාරක නිවාසය | 0.06 |
| 23 | වුන්ඩිකුලම් සංචාරක නිවාසය | 0.32 |
| 24 | මහකනදරාව සංචාරක නිවාසය | 0.04 |
| 25 | මිහින්තලේ සංචාරක නිවාසය | 0.03 |
| 26 | ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය | 0.30 |
| | එකතුව | **2,644.77** |





**රූපය 6.1:සංචාරක සේවාවන්හි වාර්ෂිකආදායම (2011-2017)**

වගුව 6.2:සංචාරකයින් වර්ගීකරණය - 2017


| ජාතික උද්‍යානය | සංචාරක පැමිණීම | | |
|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව |
| යාල | 314,606 | 290,100 | 604,706 |
| හෝටන් තැන්න | 313,579 | 121,725 | 435,304 |
| උඩවලව | 170,849 | 159,532 | 330,381 |
| වස්ගමුව | 29,189 | 2,420 | 31,609 |
| මින්නේරිය | 103,006 | 95,797 | 198,803 |
| බුන්දල | 11,860 | 10,947 | 22,807 |
| හොරගොල්ල | 5,478 | 10 | 5,488 |
| කවුඩුල්ල | 107,961 | 122,788 | 230,749 |
| ලුණුගම්වෙහෙර | 5,787 | 3,344 | 9,131 |
| ගල්ඔය | 11,169 | 3,782 | 14,951 |
| කුමන | 31,494 | 7,251 | 38,745 |
| අංගම්මැඩිල්ල | 3,478 | 08 | 3,486 |
| ගැල්වේස්ලැන්ඩ් | 6,085 | 350 | 6,435 |
| විල්පත්තු | 46,613 | 24,247 | 70,860 |
| මදුරුඔය | 2,984 | 304 | 3,288 |
| ලාහුගල | 296 | 30 | 326 |
| පරෙවි දූපත් | 79,531 | 25,128 | 104,659 |
| හික්කඩුව | 23,270 | 2,508 | 25,778 |
| උඩවලව ඇත් අතුරු සෙවන | 163,580 | 67,877 | 231,457 |
| වැලිපර අභයභූමිය | 9,578 | 3,837 | 13,415 |
| කලාවැව | 425 | 41 | 466 |
| **එකතුව** | **1,440,818** | **942,026** | **2,382,844** |




රූපය 6.2: 2017 වසරේ සංචාරක කණ්ඩායම් බෙදී යන ආකාරය




රූපය 6.3: 2017 වසරේ සංචාරක ව්‍යාප්තිය





රූපය 6.4: වසරේ සංචාරක පැමිණීම (2011-2017)

### 6.2.2. ස්වෙච්ඡා මාර්ගෝපදේශකයින්

ජාතික උද්‍යාන ආශ්‍රිතව සිදුකරන සංචාරක සේවා කටයුතු වලදී ස්වෙච්ඡා මාර්ගෝපදේශකයින් ලෙස රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන්ගෙන් තොරා ගන්නා ලද උගත්

තරුණ තරුණියන් යොදා ගැනීමේ ක්‍රියාවලියක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරයි.මෙම ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් ජාතික උද්‍යාන ආශ්‍රිතව විවරණ කටයුතු සඳහා යොදවා ගනු ලැබේ. 2011 සිට 2017 දක්වා කාලය තුළදී සේවයෙහි යොදවා ගන්නා ලද ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් සංඛ්‍යාවන් පහත දැක්වේ.




**රූපය 6.5:ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් සංඛ්‍යාව 2011-2017**

**වගුව 6.3: ජාතික උද්‍යානවල සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීමට ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් - 2017**

| අනු අංකය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 01 | කිරිඹය පාලම විවෘත කිරීමේ සඳහා සමරු ඵලකය ස්ථාපනය | 0.39 | 100% |
| 02 | ආරාධනා පත්‍ර මුද්‍රණය කිරීම -කිරිඹය පාලම විවෘත කිරීම | 0.02 | 100% |
| 03 | ආරාධනා පත්‍ර මුද්‍රණය කිරීම -ලාහුගල ජා.උ. මහවැව බංගලාව විවෘත කිරීම | 0.13 | 100% |
| 04 | කොටු අත්තාවල කුරුළු අභයභූමියේ සංචාරක පහසුකම් ඇති කිරීම | 3.90 | 85% |
| 05 | ගැල්වේස්ලැන්ඩ් ජාතික උද්‍යානයේ ස්වභාවික මංපෙත අළුත්වැඩියා කිරීම (Nature Trail) | 0.39 | 77% |
| 06 | එක්ගල්ඔය බංගලාවේ මුළුතැන්ගෙය හා වැසිකිළිය අළුත්වැඩියා කිරීම | 1.10 | 92% |
| | **එකතුව** | **5.93** | |

### 6.3. ජනවිඥුම්කරණය

### 6.3.1. කාර්ය සාධනයේ විස්තර

රක්ෂිත ප්‍රදේශ අවට ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික හැකියාවන් වැඩි දියුණු කිරීම තුලින් එම පිරිස් සංරක්ෂණ සඳහා ක්‍රියාකාරීව දායක කර ගැනීමට ජනවිඥුම්කරණ කටයුතු යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. එකී වැඩසටහන් පිළිබඳව දත්ත හා තොරතුරු වගුව 6.5 හි දැක්වේ.

### 6.3.2. ජනවිඥුම්කරණ මගින් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති සහ වැඩසටහන් - 2017

- **හොර්ටන්තැන්න පිරිසිදු කිරීමේ වැඩසටහන**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රථම වරට පෞද්ගලික අංශයේ සහය ඇතිව අරඹන ලද ව්‍යාපෘතිය ලෙස HSBC ආයතනයේ අනුග්‍රහය ඇතිව පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් 1999දී හොර්ටන්තැන්න ජාතික උද්‍යානයේදි අරඹන ලදි. ව්‍යාපෘතිය අරඹන අවධියේ එහි ප්‍රධාන අරමුණ වූයේ පොළිතීන් නිසා මිය යන ගෝනුන් ප්‍රමාණය අඩු කිරීමට විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලියක් ඇරඹීම තුළින් හොර්ටන්තැන්නෙහි සුන්දරත්වය රැකගැනීමයි. හොර්ටන්තැන්නෙහි පරිසර පද්ධතිය කසළ සහ පොළිතීන් වලින් තොරව එහි සුන්දරත්වය රැකගැනීම පිණිස මෙම ව්‍යාපෘතිය 2017 දී ද HSBC බැංකුව මූල්‍ය අනුග්‍රාහකත්වය යටතේ ක්‍රියාත්මක කෙරිණි.

- **සමනල අඩවිය ස්වාභාවික රක්ෂිතය පිරිසිදු කිරීම**

හොර්ටන්තැන්නට සමානව HSBC ආයතනයේ අනුග්‍රහයෙන් සමනල කන්ද හිදීද පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් 2007 වසරේදි ඇරඹුණු අතර 2017 දක්වා ක්‍රියාත්මක කෙරිණි. ඒ අනුව HSBC ආයතනය 2017 වසරේදි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් ප්‍රතිපාදන වල මූල්‍ය ප්‍රගතිය

**වගුව 6.4 HSBC පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය - 2017**

| ව්‍යාපෘතිය | 2017.12.31 දිනට වියදම් කල මුදල (රු.මිලියන) |
|---|---|
| හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය පිරිසිදු කිරීමේ වැඩසටහන. | 3.16 |
| සමනල අඩවිය ස්වාභාවික රක්ෂිතය පිරිසිදු කිරීම. | 1.98 |

වගුව 6.5 ජනවිහිදුම්කරණ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය - 2017

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | ප්‍රතිපාදන (රු.මිලි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | විල්පත්තු | විලච්චිය ප්‍රා.ලේ. කොට්ඨාශයේ ජනවිහිදුම්කරණ ප්‍රජාමූල සංවිධාන සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ඒ.අ | 0.07 | 100% |
| 2 | රිටිගල | රිටිගල ප්‍රජාමූල සංවිධාන සවිබල ගැන්වීම | ඒ.අ | 0.02 | 100% |
| 3 | අනුරාධපුර | හොරොව්පතාන තවලංහල්මිල්ලෑව ග්‍රාමයේ ආදායම් වර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම | ව.සං.අ | 0.07 | 100% |
| 4 | විල්පත්තු | විල්පත්තු ජා.උ. අවට පුක්කුලම ගම්මානය ඇතුලු ගම්මානවලට මී මැසි පාලනය සම්බන්ධ පුහුණු වැඩමුලුවක් පැවැත්වීම. | ව.සං.අ | 0.13 | 100% |
| 5 | විල්පත්තු | විල්පත්තුව කටුපත්වැව ග්‍රාමයේ සමාජ සජීවිකරණ හා ක්ෂුද්‍ර සැලසුම් සකස් කිරීම | ව.සං.අ | 0.13 | 100% |
| 6 | අනුරාධපුර ය | මහකනදරාව ධීවර ප්‍රජාව සඳහා ප්‍රජාපාදක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම | ව.සං.අ | 0.10 | 100% |
| 7 | හෝර්ටන් තැන්න | ඔහිය දැණුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | ඒ.අ | 0.05 | 100% |
| 8 | හෝර්ටන් තැන්න | ඩයගම රක්ෂිත ප්‍රදේශයේ ජනතාව දැණුවත් කිරීමේ වැඩසටහන | ඒ.අ | 0.04 | 100% |
| 9 | ගැල්වේස් ලෑන්ඩ් | අවට ග්‍රාමීය ජනතාව දැණුවත් කර සංවිධාන ගත කිරීම හා ශ්‍රමදාන වැඩසටහන | ඒ.අ | 0.05 | 100% |
| 10 | සමනල අඩවිය | ජීව වැට කි.මී.05 ක් දීර්ඝ කිරීම | ඒ.අ | 0.47 | 100% |
| 11 | සමනල අඩවිය | උද්‍යානය අවට ග්‍රාමීය පාසල් සිසුන් සඳහා පොත්පත් බෙදාදීම(තුඩාව, එරත්න,දෙහෙනකන්ද) | ඒ.අ | 0.08 | 100% |
| 12 | සමනල අඩවිය | ශ්‍රී පාද මාර්ගයේ පෝය 06 දැණුවත් කිරීම් හා ශ්‍රමදාන වැඩසටහන් 06 ක්‍රියාත්මක කිරීම | ඒ.අ | 0.12 | 100% |
| 13 | සමනල අඩවිය | ප්‍ර:මු:සං:සක්‍රීය කිරීමේ වැඩසටහන් 2ක් පැවැත්වීම | ඒ.අ | 0.10 | 100% |
| 14 | හෝර්ටන් තැන්න | පට්ටිපොල සමිති සාමාජිකයින් දැණුවත් කිරීම හා ශ්‍රමදාන වැඩසටහන | ව.සං.අ | 0.05 | 100% |

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | ප්‍රතිපාදන (රු.මිලි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 15 | හෝර්ටන් තැන්න | ඔහිය සමිති සාමාජිකයින් සඳහා මී මැසි පෙට්ටි (26) ලබා දීම. | ව.සං.අ | 0.12 | 100% |
| 16 | ගැල්වේස් ලෑන්ඩ් | ග්‍රාමීය ප්‍රජා ශාලාවක් අළුත්වැඩියා කිරීම | ව.සං.අ | 0.05 | 100% |
| 17 | පුත්තලම | මුන්දලම ප්‍රා.ලේ.කොට්ඨාශයේ කිවුල අංක 04, මහකුඹුක්කඩවල ක්ෂුද්‍ර සැලසුම් සකස් කිරීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | ව.සං.අ | 0.20 | 100% |
| 18 | මින්නේරිය ජා.උ. | ප්‍ර.මූල සමිති නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචනය | ඒ.අ | 0.05 | 100% |
| 19 | වස්ගමුව ජා.උ. | ප්‍රජාමූල සංවිධාන ප්‍රගති සමාලෝචනය | ඒ.අ | 0.05 | 100% |
| 20 | උඩවලව ජා.උ. | ශ්‍රමදාන වැඩසටහන් | ඒ.අ | 0.07 | 100% |
| 21 | උඩවලව ජා.උ. | ප්‍රගති සමාලෝචන රැස්වීම් | ඒ.අ | 0.05 | 100% |
| 22 | බූන්දල | ප්‍රගති සමාලෝචන රැස්වීම් 2ක් පැවැත්වීම | ඒ.අ | 0.03 | 100% |
| 23 | ගල්ඔය ජා.උ. | නිරිතදිග අභභූමි මායිමෙහි පිහිටි කෙසෙල්වත්ත ග්‍රාමයේ ජනයා දැනුවත් කිරීම හා ක්ෂේත්‍ර චාරිකාවක් රැගෙන යාම. | ඒ.අ | 0.55 | 100% |
| 24 | ගල්ඔය ජා.උ. | නැගෙනහිර සීමාවේ පිහිටි දෙමටඇල්ල ග්‍රාමයේ ජනයා දැනුවත් කිරීම හා ක්ෂේත්‍ර චාරිකාවක් රැගෙන යාම | ඒ.අ | 0.55 | 100% |
| 25 | ගල්ඔය ජා.උ. | බුදුදම වරාගම ජනයා දැණුවත් කිරීම හා ක්ෂේත්‍ර චාරිකාවක් රැගෙන යාම | ඒ.අ | 0.25 | 100% |
| 26 | ගල්ඔය ජා.උ. | නිල්ගල කුඹුරු වගා කරන ගොවි ජනයා දැනුවත් කිරීම හා ක්ෂේත්‍ර චාරිකාවක් රැගෙනයාම | ඒ.අ | 0.55 | 100% |
| 27 | ගල්ඔය ජා.උ. | මුල්ලේගම පෙර පාසලට භාණ්ඩ ලබාදීම | ඒ.අ | 0.25 | 100% |
| 28 | ගල්ඔය ජා.උ. | බදුලුවෙල පෙර පාසලට භාණ්ඩ ලබාදීම | ඒ.අ | 0.25 | 100% |
| 29 | යාල | ග්‍රාමීය ජනතාව දැණුවත් කිරීමේ වැඩසටහන් | ඒ.අ | 0.05 | 100% |

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | ප්‍රතිපාදන (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 30 | ගල්ඔය | 2017 ගල්ඔය ජාතික උද්‍යානයේ ධීවර ජනතාව සමග බෝට්ටු අංගනය පිරිසිදු කිරීම සහ ධීවර බෝට්ටු අළුත්වැඩියා කර ගැනීම සඳහා වන ශ්‍රමදාන වැඩසටහන | ව.සං.අ | 0.10 | 100% |
| 31 | ගල්ඔය ජා.උ. | ප්‍රා:ලේ: කොට්ඨාශ 03ක් ආවරණය වන පරිදි දිළිදු ළමුන් 25 ක් සඳහා පාසල් පොත් උපකරණ ලබාදීම මඩුල්ල/බිබිල | ව.සං.අ | 0.13 | 100% |
| 32 | ගල්ඔය ජා.උ. | දිළිදු පෙර පාසල් 4ක් සඳහා උපකරණ ලබාදීම | ව.සං.අ | 0.05 | 100% |
| 33 | ගල්ඔය ජා.උ. | දිළිදු පෙර පාසලක් සඳහා ගොඩනැගිල්ලක් සාදාදීම | ව.සං.අ | 1.48 | 100% |
| 34 | මඩු ස. අ. කාර්යාලය | මඩු උත්සවය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා ශ්‍රමදාන | ඒ.අ | 0.10 | 100% |
| 35 | මඩු ස. අ. කාර්යාලය | ධීවර ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් | ඒ.අ | 0.05 | 100% |
| 36 | වවුනිකුලම් | උද්‍යාන අවට ග්‍රාමීය ප්‍රජාවගේ ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | ව.සං.අ | 0.07 | 100% |
| 37 | කෝකිලායි | උද්‍යාන අවට ධීවර ප්‍රජාවගේ ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | ව.සං.අ | 0.08 | 100% |
| 38 | ඩෙල්ෆ් | උද්‍යාන අවට ග්‍රාමීය ප්‍රජාවගේ ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | ඒ.අ | 0.09 | 100% |
| 39 | වුන්ඩිකුලම් | ප්‍රජාව සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම හා ක්ෂුද්‍ර සැලස්ම සකස් කිරීම | ඒ.අ | 0.10 | 100% |
| 40 | මාදුරුඔය | උද්‍යානය අවට ගම්මාන වල ජනතාව සඳහා ස්වයං රැකියා පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | ව.සං.අ | 0.09 | 100% |

# පරිච්ඡේදය 07

## වනජීවී සෞඛ්‍ය කළමනාකරණ අංශය

### 7.1. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වගකීම්

- වනසතුන්ගේ සෞඛ්‍ය තත්වයන් සහ රෝග තත්වයන් සම්බන්ධව සුපරීක්ෂණය සහ ක්‍රියාකාරී වීම.
- වනසතුන්ගේ පශුවෛද්‍ය ආරක්ෂණය සම්බන්ධව ඵලදායී සහ වේගවත් ප්‍රතිචාර දැක්වීම.
- වනසතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම.
- සුභසාධනය පිළිබඳ සුපරීක්ෂාකාරී වීම සහ ගුණාත්මක බව වර්ධනය කිරීම.
- වනසත්ව මිනිස් ගැටුම් කළමනාකාරීත්වයට දායකවීම.
- වනසත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථාන කළමනාකරණය කිරීම.
- ඇත්අතුරු සෙවන කළමනාකරණය කිරීම.
- වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදන වලට අනුකූලව අවශ්‍ය සහතික නිකුත් කිරිම, අවශ්‍ය අවස්ථාවලදී අධිකරණ ක්‍රියාවලියට සහාය වීම.

### 7.2. 2017 වර්ෂයේ කාර්ය සාධනය

- **වනසතුන්ට ප්‍රතිකාර කිරීම**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත පශුවෛද්‍යවරුන් විසින් වර්ෂය පුරාම වනසතුන්ට ප්‍රතිකාර කිරීමෙහි නියැලුණි. වර්තමානයේ වනජීවී සංරක්ෂණයේදී වනඅලින් සඳහා ප්‍රතිකාර කිරීමට ප්‍රමුඛතාවක් දෙන අතර 2017 වර්ෂයේදී ක්‍රියාවට නංවන ලද වනඅලින්ට ප්‍රතිකාර කිරීම පිළිබඳව විස්තර සංඛ්‍යාත්මකව දත්ත වගුව 7.1 හි දැක්වේ.

**වගුව 7.1: 2017 වසරේ වන සතුන්ට ප්‍රතිකාර කිරීම**

| වනජීවී කලාපය | අලින් සංඛ්‍යාව | අනෙකුත් සතුන් සංඛ්‍යාව |
|---|---|---|
| අනුරාධපුරය | 103 | 362 |
| මධ්‍යම | 01 | 0 |
| නැගෙනහිර | 51 | 169 |
| කිලිනොච්චිය | 20 | 21 |
| වයඹ | 0 | 0 |
| පොළොන්නරුව | 160 | 296 |

| වනජීවී කලාපය | අලින් සංඛ්‍යාව | අනෙකුත් සතුන් සංඛ්‍යාව |
|---|---|---|
| ඌව | 65 | 70 |
| පුත්තලම | 0 | 0 |
| බස්නාහිර | 0 | 1,086 |
| දකුණ (ඇත්අතුරු සෙවණ) | 24 | 266 |
| ප්‍රධාන කාර්යාලය | 0 | 234 |
| ත්‍රිකුණාමලය | 09 | 19 |
| **එකතුව** | **433** | 2,523 |

- **පශ්චාත් මරණ පරීක්ෂණ සහ ප්‍රතිකාර**

  දෙපාර්තමේන්තුවේ පශුවෛද්‍ය නිලධාරීන් විසින් සිදු කරන ලද වනඅලි ප්‍රමුඛ වනසතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ 7.2 වගුවේ දැක්වේ. මෙම පශ්චාත් මරණ පරීක්ෂණ වසංගත රෝග විනිශ්චය සහ වනසතුන්ගේ සෞඛ්‍ය කටයුතු පවත්වාගෙන යාම සඳහා ඉතාම වැදගත්ය.

**වගුව 7.2: 2017 වසරේ වන සතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ**

| වනජීවී කලාපය | පශ්චාත් මරණ පරීක්ෂණ සංඛ්‍යාව | |
|---|---|---|
| | අලින් සංඛ්‍යාව | අනෙකුත් සතුන් සංඛ්‍යාව |
| අනුරාධපුරය | 56 | 03 |
| මධ්‍යම | 0 | 0 |
| නැගෙනහිර | 56 | 69 |
| කිලිනොච්චිය | 17 | 11 |
| වයඹ | 0 | 0 |
| පොළොන්නරුව | 48 | 0 |
| දකුණ(ඇත්අතුරු සෙවණ) | 17 | 121 |
| ඌව | 13 | 45 |
| ප්‍රධාන කාර්යාලය | 0 | 03 |
| පුත්තලම | 0 | 0 |
| බස්නාහිර | 0 | 33 |
| ත්‍රිකුණාමලය | 25 | 0 |
| **එකතුව** | **232** | **285** |

**7.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ හා වනජීවී සංරක්ෂණ අරමුදලේ කලාපීය වශයෙන් දායකත්වය දැක්වූ ක්‍රියාකාරකම් 7.3 වගුවේ දැක්වේ.**

**වගුව 7.3: 2017වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය**

| අනු අංකය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගති 100% | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|
| 1. | capture guns මිළදී ගැනිම | ඒ.අ | **100%** | 16.12 |
| 2. | අත්තිඩිය වනජීවී රැඳවුම් මධ්‍යස්ථානය මගින් හෝමගම මුවන් ඇල්ලිම | ව.සං.අ | **50%** | 0.70 |
| **එකතුව** | | | | **16.82** |

## පරිච්ඡේදය 08

## ඉංජිනේරු අංශය

### 8.1. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වගකීම්

- රක්ෂිත ප්‍රදේශ තුළ භෞතික පහසුකම් වැඩිදියුණු කිරීමේ සහ ඉදිකිරීම් සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- රක්ෂිත ප්‍රදේශ තුළ සහ අවට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තුව සහ ඉදිකිරීම.
- රක්ෂිත ප්‍රදේශ තුළ මාර්ග පද්ධතිය නඩත්තුව සහ ඉදිකිරීම.

### 8.2. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන කාර්යාලයේ සහ ක්ෂේත්‍රයේ ගොඩනැගිලි ඉදිකිරීම සහ අළුත්වැඩියා කිරීම

- ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම

ප්‍රධාන කාර්යාලයේ සහ ක්ෂේත්‍රයේ අළුත්වැඩියා කරන ලද ගොඩනැගිලි සම්බන්ධ වගුව 8.1 හි දැක්වේ.

**වගුව 8.1: 2017 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ සහ ක්ෂේත්‍ර ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.**

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|---|---|---|
| 01 | ගැල්වේස් ලෑන්ඩ් | කාර්ය මණ්ඩලය සඳහා උණුවතුර ටැංකියක් හා නල පද්ධතිය සවි කිරීම | ඒ.අ | 100% | 0.06 |
| 02 | මධ්‍යම | තංගමලේ බිට්ටුවට නල ළිදක් සවි කිරීමට ස්ථානීය පරීක්ෂණයක් කිරීම | ඒ.අ | 100% | 0.04 |
| 03 | මධ්‍යම | ඔභිය ප්‍රවේශ පත්‍ර කවුළුවට සිවිලිම ගැසීම | ඒ.අ | 100% | 0.07 |
| 04 | මධ්‍යම | අඩවි ආරක්ෂක නිල නිවසේ සිවිලිම අළුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 0.39 |
| 05 | මධ්‍යම | කාර්යාලය තුල පරිගණක ඒකකයක් ස්ථාපිත කිරීම | ඒ.අ | 100% | 0.02 |
| 06 | මධ්‍යම | ස.අ. නිල කාමරය සඳහා වායුසමීකරණ යන්ත්‍රයක් සවි කිරීම | ඒ.අ | 100% | 0.11 |
| 07 | හෝර්ටන් ජා.උ | ගිනිහිරිය සංචාරක බංගලාව අළුත්වැඩියාව | ව.සං.අ | 35% | 1.44 |

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|---|---|---|
| 08 | ප්‍රධාන කාර්යාලය | විදුලි පද්ධතියේ ධාරිතාව වැඩිකරවා ගැනීම | ඒ.අ | 100% | 1.45 |
| 09 | බස්නාහිර | දොඩන්දුව සමුද්‍ර සංරක්ෂණ මධ්‍යස්ථානය විදුලිය ,ජලය හා දුරකථන පහසුකම් ලබා දීම | ඒ.අ | 100% | 0.05 |
| 10 | ප්‍රධාන කාර්යාලය | ප්‍රධාන කාර්යාලයේ තින්ත අලේප කිරිම | ව.සං.අ | 80% | 2.30 |
| 11 | ප්‍රධාන කාර්යාලය | වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරිම | ව.සං.අ | | |
| 12 | අනුරාධපුරය | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඇති වනජීවී කාර්යාලය අළුත්වාඩියා කිරීම | ඒ.අ | 100% | 0.65 |
| 13 | අනුරාධපුරය | අඩවි ආරක්ෂක නිල නිවස වටා බැම්මක් සවිකිරීම | ඒ.අ | 100% | 0.59 |
| 14 | මහවිලච්චිය | කාර්යාලය හා නිල නිල නිවසේ වහලය අළුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 0.34 |
| 15 | අලිවාඩිය අඩවිය | අලිවාඩිය කාර්යාලයේ ජනෙල් වලට ග්‍රිල් සවිකිරීම | ඒ.අ | 100% | 0.06 |
| 16 | අනුරාධපුරය | මොරගොඩ බීට්ටු කර්යාලය සඳහා ග්‍රිල් සවිකිරීම | ඒ.අ | 100% | 0.08 |
| 17 | අනුරාධපුරය | ස.අ. කා. වටා දැල් වැටක් ඉදිකිරීම | ඒ.අ | 100% | 0.89 |
| 18 | අනුරාධපුරය | ස.අ නිල නිවස වටා කම්බි වැට අළුත්වැඩියා කිරිම | ඒ.අ | 100% | 0.41 |
| 19 | අනුරාධපුරය | කුකුල්කටුව බීට්ටු කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 0.58 |
| 20 | අනුරාධපුර | අලගොල්ලෑව බීට්ටුවට විදුලිය ලබා ගැනීම. | ඒ.අ | 100% | 0.37 |
| 21 | අනුරාධපුර | කලා වැව ජා,උ කාර්යාලයට විදුලිය ලබා ගැනිම | ඒ.අ | 100% | 0.02 |
| 22 | අනුරාධපුර | අනුරාධපුර සහකාර අධ්‍යක්ෂ කාර්යාලයේ වැසිකිලි පහසුකම් ඉදි කිරිම | ව.සං.අ | 100% | 0.5 |
| 23 | දකුණ | උඩවලව ජා.උ පිවිසුමේ තින්ත ආලේප කිරීම | ඒ.අ | 100% | 0.02 |
| 24 | දකුණ | පනහඩුව අඩවි ආරක්ෂක කාර්යාලයේ ගිණි අවි රඳවනයක් ඉදිකිරීම. | ඒ.අ | 100% | 0.05 |
| 25 | දකුණ | බුන්දල ජාතික උද්‍යානයේ ආමරිය වැඩි දියුනු කිරීම. | ඒ.අ | 100% | 0.07 |

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|---|---|---|
| 26 | දකුණ | බුන්දල ජාතික උද්‍යානයේ උ.භාරකරුගේ කාමරය බෙදා වෙන් කිරීම. | ඒ.අ | 100% | 0.17 |
| 27 | දකුණ | ස.අ. කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 2.00 |
| 28 | දකුණ | සහකාර අධ්‍යක්ෂ කාර්යාලය අසල ඇති ඒකාබද්ධ නිල නිවස ලඟ පිහිටි වැසිකිලි වල අලුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 0.08 |
| 29 | උඩවලව ජා.උ. | පනාහඩුව අඩවි ආරක්ෂක කාර්යාලයට ජලය ලබා ගැනීම | ඒ.අ | 100% | 0.02 |
| 30 | උඩවලව ජා.උ. | පනහඩුව අඩවි ආරක්ෂක කාර්යාලයට විදුලිය ලබා ගැනීම | ඒ.අ | 100% | 0.02 |
| 31 | යාල | බංගලා භාරකරු නිල නිවස අළුත් වැඩියා කිරිම | ව.සං.අ | 100% | 0.13 |
| 32 | හම්බන්තොට අඩවිය | අඩවි කාර්යාලය අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 0.97 |
| 33 | කතරගම | කතරගම අඩවි කාර්යාලය අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 2.40 |
| 34 | ඌව | ස.අ. කාර්යාලයේ ගෙබිම අළුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 0.70 |
| 35 | ඌව | එක්ගල්ඔය බංගලාවේ මුළුතැන්ගෙය හා වැසිකිළිය අළුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 1.09 |
| 36 | ඌව | වෙහෙරගල බීට්ටු කාර්යාලය අළුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 0.71 |
| 37 | ඌව | දෙමලිය බීට්ටුව අලුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 0.58 |
| 38 | ඌව | එක්ගල්ඔය සංචාරක නිවාසය සඳහා ජලය ලබා ගැනීම | ඒ.අ | 100% | 0.02 |
| 39 | ඌව | කරිවිලේ බීට්ටු කාර්යාලයට ජලය ලබා ගැනීම | ඒ.අ | 98% | 0.03 |
| 40 | ඌව | දඹකොමේ සංචාරක බංගලාව අළුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 0.65 |
| 41 | ගල්ඔය | හත්පොත බිට්ටු කාර්යාලය අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 0.60 |
| 42 | යාල ජා.උ | කැබිලිත්ත පන්සල වටා ආරක්ෂිත වැටක් ඉදි කිරිම | ව.සං.අ | 100% | 0.11 |
| 43 | ලුණුගම්වෙහෙර ජා.උ | තල්ගහදිගන සංචාරක බංගලාව අළුත්වැඩියා කිරිම | ව.සං.අ | 100% | 1.41 |

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 44 | ලුණුගම්වෙහෙර ජා.උ | වෙහෙරගල සංචාරක බංගලාව අළුත්වැඩියා කිරීම | ව.සං.අ | 100% | 1.29 |
| 45 | යාල ජා.උ | බූතව ටැංකිය අළුත්වැඩියා කිරීම | ව.සං.අ | 100% | 0.24 |
| 46 | යාල ජා.උ | ගල්ලුක්කන ටැංකිය අළුත්වැඩියා කිරීම | ව.සං.අ | 100% | 2.25 |
| 47 | යාල ජා.උ | බූතව සංචාරක බංගලාව අළුත්වැඩියා කිරීම | ව.සං.අ | 100% | 0.40 |
| 48 | උඩවලව ජා.උ | පිවිසුම් මූලස්ථානයේ ගොඩනැගිලි අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 1.5 |
| 49 | උඩවලව ජා.උ | පොකුනුතැන්න සංචාරක බංගලාව අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 1.9 |
| 50 | මවුආර් බිට්ටුව | ආරක්ෂක හා බලශක්ති කුටි අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 0.22 |
| 51 | උඩවලව ජා.උ | ඇත් අතුරු සෙවනේ නරඹන්නන්ගේ වේදිකාව අළුත්වැඩියා කිරීම | ව.සං.අ | 100% | 1.66 |
| 52 | උඩවලව ජා.උ | ඇත් අතුරු සෙවනේ ඒකාබද්ධ නිල නිවස අළුත්වැඩියා කිරීම | ව.සං.අ | 100% | 0.67 |
| 53 | අංගමැඩිල්ල ජා.උ | නැරඹුම් මන්දිරයේ විදුලි රැහැන් ඉවත් කිරීම | ඒ.අ | 100% | 0.02 |
| 54 | මින්නේරිය | අ.ආ. නිල නිවාසය අළුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 0.46 |
| 55 | මින්නේරිය | වැසිකිළි වල ඉදි කිරීම | ව.සං.අ | 100% | 0.56 |
| 56 | කවුඩුල්ල ජා,උ | ගොඩනැගිලි පද්ධතිය අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 1.85 |
| 57 | පොළොන්නරුව | සහකාර අධ්‍යක්ෂ කාර්යාලය අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 1.5 |
| 58 | පිඹුරුත්තැව බිට්ටු කාර්යාලය | පිඹුරුත්තැව බිට්ටු කාර්යාලය අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 2.50 |
| 59 | විල්පත්තු ජා.උ | කටුපත් වැව අළුත්වැඩියා කිරීම | ව.සං.අ | 100% | 0.65 |
| 60 | රිටිගල | අලගොල්ල බිට්ටු කාර්යාලයේ විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීම | ව.සං.අ | 100% | 0.14 |
| 61 | ගිරිබාව බීට්ටුව | බීට්ටු කාර්යාලයේ අලුත්වැඩියාව | ඒ.අ | 100% | 0.99 |
| 62 | වයඹ | කලාඔය ජතික උද්‍යානයේ විජිතපුර පිවිසුම් කාර්යාලය සඳහා ජලය හා විදුලිය ලබා දීම | ඒ.අ | 100% | 0.04 |
| 63 | වයඹ | කොටුඅත්තාවල කුරුළු අභය භූමියේ ඇති කාර්යාලයට විදුලිය ලබා ගැනීම | ඒ.අ | 100% | 0.43 |

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 64 | පිබිදුණුගම බීට්ටුව | බීට්ටු කාර්යාලය සඳහා ලබාදුන් ගොඩනැගිල්ලේ වහලය පින්තාරු කිරීමහා අත්වැට සැකසීම | ඒ.අ | 100% | 0.42 |
| 65 | කරුවලගස්වැව අඩවිය | කරුවලගස්වැව අ.ආ. කාර්යාලය අළුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 0.78 |
| 66 | කරුවලගස්වැව අඩවිය | කරුවලගස්වැව අඩවි ආරක්ෂක කාර්යාලයේ ජල නල පද්ධතිය ඉදිකිරීම | ඒ.අ | 100% | 0.37 |
| 67 | ආනවිලුන්දාව | ආනවිලුන්දාව බීට්ටු කාර්යාලයට පානීය ජලය ලබා ගැනීම | ඒ.අ | 100% | 0.02 |
| 68 | ගල්ගමුව අඩවිය | අඩවි කාර්යාලය අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 0.69 |
| 69 | නැගෙනහිර | ස.අ. නිල නිවාසයේ කාමර 2ක් ටයිල් කිරීම හා කුස්සියට පැන්ට්‍රි කබඩ් ගැසීම | ඒ.අ | 100% | 0.47 |
| 70 | නැගෙනහිර | ස.අ නිල නිවස සඳහා අළුතින් වැසිකිලි වලක් ඉදිකිරීම | ව.සං.අ | 100% | 0.12 |
| 71 | ලාහුගල | ලාහුගල ජා.උ ඒකාබද්ධ නිල නිවසට විදුලිය ලබා ගැනීම | ඒ.අ | 100% | 0.13 |
| 72 | මාදුරුඔය ජා.උ | කන්දේගම බීට්ටු කාර්යාලයට විදුලි රැහැන් ඇදීම | ඒ.අ | 100% | 0.16 |
| 73 | කුමන ජා.උ | තුම්මුල්ල සංචාරක බංගලාවේ වැසිකිලි හා නාන කාමරය අළුත්වැඩියා කිරීම | ව.සං.අ | 100% | 0.42 |
| 74 | නැගෙනහිර | ඒකාබද්ධ නිල නිවස අළුත්වැඩියා කිරීම | ව.සං.අ | 100% | 2.59 |
| 75 | දමන බිට්ටුව | බිට්ටු කාර්යාලය සඳහා ග්‍රීල් සවි කිරීම | ව.සං.අ | 100% | 0.06 |
| 76 | දමන අඩවිය | අඩවි කාර්යාලය අළුත්වැඩියාව | ව.සං.අ | 60% | 0.35 |
| 77 | මන්නාරම | මන්නාරම අඩවි ආරක්ෂක කාරියාලය සඳහා විදුලිය ලබා ගැනීම | ඒ.අ | 100% | 0.08 |
| 78 | මන්නාරම | මන්නාරම අඩවි ආරක්ෂක කාරියාලය සඳහා ජලය ලබා ගැනීම | ඒ.අ | 100% | 0.04 |
| 79 | වන්කාලේ | වංකාලෙයි වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 0.40 |
| 80 | වව්නියාව | පදවිය අඩවි ආරක්ෂක කාර්යාලයට විදුලිය ලබා ගැනීම | ඒ.අ | 100% | 0.02 |

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 81 | ත්‍රිකුණාමලය | පරවි දූපත් නව කාර්යාලය සඳහා විදුලිය ලබා ගැනීම | ඒ.අ | 100% | 0.02 |
| 82 | ගිරිතලේ | අංක 02 වනජීවි සංචාරක නිවස අළුත්වැඩියාව | ඒ.අ | 100% | 0.03 |
| 83 | ගිරිතලේ | සම්පත් නිලධාරි නිවස නො.04 අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 1.95 |
| 84 | ගිරිතලේ | සම්පත් නිලධාරි නිවස නො.06 අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 2.61 |
| 85 | ගිරිතලේ | කාර්යාල ගොඩනැගිල්ල, ඒකාබද්ධ නිවාස සහ මුළුතැන්ගෙය අලුත්වැඩියා කිරීම | ව.සං.අ | 100% | 7.1 |
| 86 | ගිරිතලේ | අඩවි ආරක්ෂක නිල නිවස අළුත්වැඩියාව | ව.සං.අ | 100% | 1.30 |

(ඒ.අ.-ඒකාබද්ධ අරමුදල, ව.සං.අ. – වනසත්ව සංරක්ෂණ අරමුදල)

- **නව ගොඩනැගිලි ඉදිකිරීම**

නව ගොඩනැගිලි ඉදිකිරීම්වලට පිළිබඳ තොරතුරු වගුව 8.2 හි දැක්වේ. එම ඉදිකිරීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඒකාබද්ධ අරමුදලෙන්(ඒ.අ) සහ වනජීවී සංරක්ෂණ අරමුදලෙන්(ව.ස.අ) වෙන් කරන ලදී.

**වගුව 8.2: 2017 වර්ෂයේ නව ගොඩනැගිලි ඉදිකිරීම**

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | අංගම්මැඩිල්ල ජා.උ. | නිකවැව බීට්ටු කාර්යාලය ඉදිකිරීම | ඒ.අ | 50% | 2.95 |
| 2 | පොලොන්න රුව | වස්ගමුව ජා.උ ගිණිඅවි රඳවනයක් සවිකිරීම. | ඒ.අ | 100% | 0.15 |
| 3 | දකුණ | කලමැටිය අඩවි ආරක්ෂක කාර්යාලයට ගරාජයක්ඉදිකිරීම. | ඒ.අ | 100% | 0.58 |
| 4 | දකුණ | ගල්කොටුකන්ද බීට්ටුවට ගරාජයක් ඉදිකිරීම. | ඒ.අ | 100% | 0.58 |
| 5 | මුලතිව් අඩවිය | මුලතිව් අ.ආ. කාර්යාලය හා ඒකාබද්ධ නිල නිවාසය ඉදිකිරීම | ඒ.අ | 20% | 1.68 |
| 6 | කුමන ජා.උ | වනජීවී කාර්ය මණ්ඩල සංචාරක නිවාසය ඉදිකිරීම | ව.සං.අ | 100% | 4.04 |

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 7 | කුමන ජා.උ | ස.අ නිල නිවසේ වැසිකිලි වල ඉදිකිරීම | ව.සං.අ | 100% | 0.012 |
| 8 | දමන | දමන අ. ආ. කාර්යාලයට ගරාජයක් ඉදිකිරීම | ඒ.අ | 100% | 0.57 |
| 9 | ලාහුගල ජා.උ | වනජීවී සංචාරක නිවාසය ඉදිකිරීම | ව.සං.අ | 100% | 4.27 |
| 10 | ලාහුගල ජා.උ | සපත්තු පාළම් ඉදි කිරිම | ව.සං.අ | 100% | 0.21 |
| 11 | ගල්ඔය ජා.උ | නිල්ගල වැසිකිලි පද්ධතිය ඉදි කිරිම | ව.සං.අ | 100% | 0.80 |
| 12 | ගල්ඔය ජා.උ | උද්‍යානයේ වැසිකිලි වල ඉදි කිරිම | ව.සං.අ | 100% | 0.10 |
| 13 | ගල්ඔය ජා.උ | බන්ට් හවුස් සංචාරක බංගලාවට වැසිකිලි පද්ධතියක් ඉදි කිරිම | ව.සං.අ | 100% | 0.62 |
| 14 | කන්තලේ අඩවිය | අඩවි කාර්යාලය හා නිල නිවස ඉදි කිරිම | ව.සං.අ | 40% | 0.88 |
| 15 | ත්‍රිකුණාමලය | නව වැසිකිලි පද්ධතියක් හා කාමර ඉදි කිරිම | ව.සං.අ | 100% | 7.39 |
| 16 | ලුණුගම්වෙහෙර ජා.උ | ගරාජයක් ඉදි කිරිම | ව.සං.අ | 100% | 1.67 |
| 17 | ලුණුගම්වෙහෙර ජා.උ | බෝල්සවැවබිට්ටුවට මාර්ග බාධකයක් ඉදි කිරිම | ව.සං.අ | 100% | 0.15 |
| 18 | යාල ජා.උ | පරණ තොටුපළට සංචාරක බංගලාවඉදි කිරිම | ව.සං.අ | 100% | 10.07 |
| 19 | යාල ජා.උ | කටගමුව උද්‍යාන මූලස්ථානය හා ප්‍රවේශ පත්‍ර කවුළුව ඉදි කිරිම | ව.සං.අ | 100% | 6.02 |
| 20 | යාල ජා.උ | කටගමුව බංගලා භාරකරු නිල නිවසඉදි කිරිම | ව.සං.අ | 100% | 3.39 |
| 21 | යාල ජා.උ | කටගමුව සේවක කාර්ය මණ්ඩල නිල නිවසඉදි කිරිම | ව.සං.අ | 85% | 4.50 |
| 22 | යාල ජා.උ | කටගමුවමූලස්ථාන කාර්යාලය හා ප්‍ර වේශ පත්‍ර කවුළුව ඉදි කිරිම (අදියර 1) | ව.සං.අ | 89% | 11.94 |
| 23 | යාල ජා.උ | හින්වැව බිට්ටු කාර්යාලය ඉදි කිරිම | ව.සං.අ | 100% | 1.25 |

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 26 | යාල ජා.උ | ප්‍ර වේශ පත්‍ර කවුළුව හා තොරතුරු මධ්‍යස්ථානය ඉදි කිරිම | ව.සං.අ | 100% | 1.20 |
| 27 | යාල ජා.උ | කටගමුව කාර්ය මණ්ඩල නිල නිවස ඉදි කිරිම | ව.සං.අ | 100% | 13.22 |
| 28 | යාල ජා.උ | පහලහෙන්තොට සංචාරක බංගලාව ඉදි කිරිම | ව.සං.අ | 100% | 9.23 |
| 29 | පනහඩුව | අඩවි කාර්යාලය හා නිල නිවස ඉදි කිරිම | ව.සං.අ | 100% | 9.12 |
| 30 | දකුණ | කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන ඉදි කිරිම | ව.සං.අ | 100% | 0.72 |
| 31 | දකුණ | කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන වල විවේක ස්ථාන ඉදි කිරිම | ව.සං.අ | 100% | 3.56 |
| 32 | ප්‍රධාන කාර්යාලය | මූල්‍ය අංශය සඳහා ඉහලින් දෙවන මහල දිගු කිරීම | ව.සං.අ | 15% | 1.26 |
| 33 | පදවිය අඩවිය | පදවිය අඩවි ආරක්ෂක කාර්යාලය ඉදි කිරිම | ඒ.අ | 100% | 4.07 |
| 34 | වස්ගමුව ජා.උ | ගලේ බංගලාවේ ජල මෝටරය සඳහා කාමරයක් තැනීම හා නල මාර්ගයේ ඉදිකිරිම | ව.සං.අ | 100% | 0.31 |

(ඒ.අ.-ඒකාබද්ධ අරමුදල, ව.සං.අ. – වනසත්ව සංරක්ෂණ අරමුදල)

## 8.3. මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාව තුළ රක්ෂිත ප්‍රදේශ ජාලයේ ක්‍රමික වැඩිවීමක් පසුගිය අවුරුදු කීපය තුළ පෙන්වන අතර මෙම රක්ෂිත ප්‍රදේශ තුළ වනජීවි සම්පත් වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සහ සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස මාර්ග පද්ධතිය ක්‍රමානුකූලව පවත්වාගෙන යාම අත්‍යවශ්‍යය. ඒ සඳහා දැනට ඇති රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ ක්‍රමවත් මාර්ග පද්ධතියක් තිබීම අත්‍යාවශ්‍යය.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිත ප්‍රදේශවල මාර්ග පද්ධතිවල ප්‍රතිසංස්කරණය කිරීම. 2017 වර්ෂය තුළදී සිදු කරනලද ක්‍රියාකාරකම්වල විස්තර 8.3 වගුවේ දැක්වේ.

වගුව **8.3:** මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම - **2017**

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | විල්පත්තු ජා.උ. | මරදන්මඩුව මහවැව මාර්ගය Causway යොදා පිළිසකර කිරීම | ඒ.අ | 100% | 1.91 |
| 2 | අලිවාඩිය අඩවිය | අලිවාඩිය පිවිසුම් මාර්ගය අළුත්වැඩියා කිරීම (සපත්තු පාලම් 2ක් සහිතව) | ඒ.අ | 100% | 0.99 |
| 3 | හොරොව්පතාන | හොරොව්පතාන මාර්ගය | ඒ.අ | 100% | 2.04 |
| 4 | ලාහුගල ජා.උ. | ලාහුගල ජා.උ.පැරණි මාර්ග පද්ධතිය මොටර් ග්‍රේඩ් කිරීම | ඒ.අ | 100% | 0.95 |
| 5 | මාදුරුඔය ජා.උ. | එන්ඩී කෙ වැව ඉස්මතෙන් ඕමුණුගල හරහා පනිජ්ජාඔය බීට්ටු කාර්යාලය දක්වා මාර්ගය අළුතින් සැකසීම (28 කි.මි) | ඒ.අ | 100% | 3.17 |
| 6 | මාදුරුඔය ජා.උ. | දමනෙවෙල හෙනානිගල පලටුපාන හරහා රත්කිඳ බීට්ටුව දක්වා මාර්ගය අළුතින් සැකසීම (25 කි.මි) | ඒ.අ | 100% | 2.69 |
| 7 | කුමන ජා.උ. | ප්‍රධාන මාර්ගයෙ කෝසු 02ක් බෝක්කු 03ක් ගෙවල් යොදා පාර දෙපැත්තෙ කාණු පද්ධතිය සැකසීම හා Motor grader කිරීම | ඒ.අ | 100% | 2.81 |
| 8 | කුමන ජා.උ. | කුමන ජා.උ කාර්ය මණ්ඩල නිවාසයේ පිවිසුම් මාර්ගය අළුත්වාඩියා කිරීම | ඒ.අ | 100% | 0.32 |
| 9 | උඩවලව ජා. උ. | ජා. උද්‍යානය තුල පවතින මාර්ග ප්‍රතිසංස්කරණය කිරිම1(කි.මි 150) | ඒ.අ | 100% | 7.74 |
| 10 | උඩවලව ජා. උ. | අත්‍යාවශ්‍ය ස්ථාන වල බෝක්කු හා කෝසු යෙදීම2(කෝසු 19) | ඒ.අ | | |
| 11 | යාල ජා/උ | කලාප අංක 5 වෙහෙරගල-සෙල්ලංගල - සල්මල්පැලැස්ස මාර්ගයෙ අඩි 60 සපත්තු පාලම් 3 හා අඩි 40 සපත්තු පාලම් 01 හා අඩි 30 සපත්තු පාලම් 02ක් ඉදිකිරිම1 | ඒ.අ | 100% | 3.13 |

| අනු අංකය | ස්ථානය | ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 12 | යාල ජා/උ | සපත්තු පාලම් ඉදිකිරිම- කළාප අංක 05 | ව.සං.අ | 100% | 19.15 |
| 13 | ගල්ඔය ජා. උ. | නිල්ගල බුළුපිටිය මාර්ගය මෝටර් ග්‍රේඩර් කර බොරළු දමා සැකසීම. | ඒ.අ | 100% | 2.73 |
| 14 | ගල්ඔය ජා. උ. | හත්පොත සිට කොස්සාපොල මාර්ගය මෝටර් ග්‍රේඩර් කර බොරළු දමා සැකසීම. | ඒ.අ | 100% | 1.99 |
| 15 | ගල්ඔය ජා. උ. | නිල්ගල මකර මාර්ගය මෝටර් ග්‍රේඩර් කර බොරළු දමා සැකසීම | ඒ.අ | 100% | 1.99 |
| 16 | වස්ගමුව ජා.උ. | කදුරුපිටිය- ඇල්ලේ ඔය දක්වා මාරගය අළුත්වැඩියාව | ඒ.අ | 100% | 1.21 |
| 17 | වස්ගමුව ජා.උ. | සොරවිලගල මාර්ගය අළුත්වැඩියා කිරීම | ඒ.අ | 100% | 1.02 |
| 18 | මින්නේරිය ජා.උ. | කිරිදිඔය - මහවැව මාර්ගය ඉදිකිරීම | ඒ.අ | 100% | 1.06 |
| 19 | කරුවලගස්වැව අඩවිය | අ. කාර්යාල පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය | ඒ.අ | 100% | 0.94 |

(ඒ.අ.-ඒකාබද්ධ අරමුදල, ව.සං.අ. – වනසත්ව සංරක්ෂණ අරමුදල)

# පරිච්ඡේදය 09

## පාලන අංශය

### 9.1. ප්‍රධාන ක්‍රියකාරකම් සහ වගකීම්

- මානව සම්පත් සහ සාමාන්‍ය පරිපාලන සැලසුම් පිළියෙල කිරීම.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම,උසස් කිරිම, පුරප්පාඩු පිරවීමට කටයුතු කිරිම.
- කාර්ය මණ්ඩලයට අදාල ස්ථානමාරු සම්බන්ධව කටයුතු කිරීම, සේවා දීර්ස, විශ්‍රාම ගැන්වීම, විශ්‍රාම වැටුප් සහ වැන්දඹු සහ අනත්දරු අරමුදල් පිළිබඳ කටයුතු සිදුකිරීම.
- දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධව විනය කටයුතු සිදු කිරීම.
- හදිසි අනතුරු වන්දි ගෙවීමේ කටයුතු
- නිලධාරීන්ගේ කාර්ය සාධන කටයුතු සහ වැටුප් වර්ධක ගෙවීමේ කටයුතු
- ක්ෂේත්‍ර ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියාව.
- ප්‍රවාහන කටයුතු අධීක්ෂණය

### 9.2. බඳවා ගැනිම් හා උසස් කිරීමේ පරිපාටි

#### 9.2.1. කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනිම

2017 වර්ෂය තුල බඳවා ගැනීම් සිදු කොට නැත.

#### 9.2.2 ශ්‍රේණි උසස්වීම්

2017 වර්ෂය තුළ සිදු කළ ශ්‍රේණි උසස්වීම් පහත දක්වා ඇත.

වගුව **9.1: උසස්වීම් - 2017**

| තනතුර | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය 11 ශ්‍රේණියට | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර-11 ශ්‍රේණියට | 04 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර-1 ශ්‍රේණියට | 01 |
| වනසත්ත්ව අධ්‍ය සහකාර- 1 ශ්‍රේණියට | 03 |
| වනසත්ත්ව නියාමක - 11 ශ්‍රේණියට | 68 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර 3 පන්තියේ 11 ශ්‍රේණියට | 01 |
| රියදුරු -11 ශ්‍රේණියට | 03 |
| රියදුරු -1 ශ්‍රේණියට | 05 |
| කා.කා.ස - 1 ශ්‍රේණියට | 01 |
| සහකාර බංගලා භාරකරු-11ශ්‍රේණියට | 03 |
| ක්ෂේත්‍ර සහයක -11 ශ්‍රේණියට | 03 |
| ක්ෂේත්‍ර සහයක -1 ශ්‍රේණියට | 16 |

### 9.2.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමත කර ගන්නා ලද බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටි

තනතුර දරන්නාට පෞද්ගලික වන සේ අනුමත ක්ෂේත්‍ර සහායක තනතුරු සඳහා උසස් කිරීමේ පරිපාටිය සකස් කර ඇති අතර ඒ සඳහා රාජ්‍ය සේවා කොමසම මගින් අනුමැතිය ලබා දී ඇත.

## 9.3 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2017

වගුව **9.2: කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2017**

| විභාගයේ නම |
|---|
| වනසත්ත්ව අඩවි ආරක්ෂක කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය |
| වනසත්ත්ව අඩවි සහකාර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය |
| වනසත්ත්ව නියාමක කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය |
| කාර්මික සහකාර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය |
| සැළසුම් ශිල්පී කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය |
| යන්ත්‍ර ක්‍රියාකරු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය |

## 9.4 විනය පරීක්ෂණ

2017 වර්ෂයේ විධිමත් විනය පරීක්ෂණ 03ක් පවත්වා ඇති අතර ඉන් 02 ක් අවසන්ව ඇත.

## 9.5. අග්‍රහාර අරමුදල් ප්‍රතිලාභ ගෙවීම

අග්‍රහාර අරමුදල් පහත පරිදි ගෙවා ඇත.

වගුව **9.3: අග්‍රහාර අරමුදල් ගෙවීම - 2017**

| අග්‍රහාර අරමුදල් ප්‍රතිලාභ | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| හදිසි අනතුරු | 05 |
| ඇස් කණ්නාඩි | 138 |
| දරු ප්‍රසූති සඳහා | 18 |
| රෝහල් ගත වීම | 117 |
| හදිසි මරණ | 05 |

## 9.6. විශ්‍රාම ගෙවීම් සහ මරණ පාරිතෝෂිත

වගුව **9.4:** විශ්‍රාම ගෙවීම් සහ මරණ පාරිතෝෂිත

| තනතුරු | විශ්‍රාම ගැන්වීම් සංඛ්‍යාව | විශ්‍රාම ගෙවීම් | මරණ සංඛ්‍යව | මරණ පාරිතෝෂික ගෙවීම් |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 01 | 01 | - | - |
| ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 01 | 01 | - | - |
| පරිපාලන නිලධාරී | 01 | 01 | - | - |
| අඩවි ආරක්ෂක | 13 | 13 | 02 | 02 |

| තනතුරු | විශ්‍රාම ගැන්වීම් සංඛ්‍යාව | විශ්‍රාම ගෙවීම් | මරණ සංඛ්‍යව | මරණ පාරිතෝෂික ගෙවීම් |
|---|---|---|---|---|
| අඩවි සහකාර | 12 | 12 | 02 | 02 |
| වනසත්ත්ව නියාමක | 08 | 08 | 01 | 01 |
| රා.කළ.සහකාර | 03 | 03 | 01 | 01 |
| රියදුරු | 02 | 02 | - | - |
| කා.සේ.සේ | 01 | 01 | - | - |
| ක්ෂේත්‍ර සහයක | - | - | 01 | - |

## 9.7. හදිසි අනතුරු වන්දි ගෙවීම

**වගුව 9.5. හදිසි අනතුරු වන්දි ගෙවීම**

| හදිසි අනතුරු | ගෙවූ සංඛ්‍යාව | වන්දි ගෙවූ කාලය |
|---|---|---|
| වනසත්ත්ව අඩවි සහකාර | 01 | මාස 31.5 |
| වනසත්ත්ව නියාමක | 01 | මාස 09 |

## 9.8. ණය පහසුකම්

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සුදුසු අයදුම්කරුවන් සඳහා පහත ණය මුදා හැරිණ.

වගුව 9.6: ණය පහසුකම් - 2017

| ණය වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| ආපදා ණය | 431 |
| පා පැදි ණය | 11 |
| දේපළ ණය | 14 |

## 9.9. ජංගම සේවා පැවැත්වීම

2017 වර්ෂය සඳහා ජංගම සේවා පවත්වා නැත.

# පරිච්ඡේදය 10

## මුදල් අංශය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මුදල් අංශය කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණයක් පවත්වා ගෙන යාම තුලින් දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටුකිරීමට අවශ්‍ය මූල්‍ය සම්පත් හා නිසි මගපෙන්වීමක් ලබා දෙමින් සියළුම අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ අනෙකුත් රජයේ ආයතන සමඟ බැඳුණු කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

### 10.1. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වගකීම්

- දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් ශීර්ෂ වල ඇස්තමේන්තු පිළියෙල කිරිම
- වනසත්ව සංරක්ෂණ අරමුදලේ ආදායම් සහ වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම
- මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගැනීම, එම කලාප කාර්යාලවලට ඒවා ලබාදීම, ප්‍රාදේශීය කාර්යාලවල අග්‍රිම ප්‍රතිපූර්ණය, සියළුම ලැබීම් ගෙවීම් ගිණුම්ගත කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට මාසිකව වාර්තා කිරීම හා මාසික ගිණුම් වාර්තා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සැසඳීම
- වාර්ෂිකව ආදායම්, වියදම්, වනසත්ව සංරක්ෂණ අරමුදල, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සහ පොදු තැන්පත් සඳහා ගිණුම් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් ඉටු කරනු ලබන සියළු ප්‍රසම්පාදන කටයුතු
- ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ කටයුතු අධීක්ෂණය හා පාලනය
- විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන සියළුම විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ විමසුම් සඳහා පිළිතුරු සැපීම

### 10.2. ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම.

- නව ප්‍රධාන කාර්යාලය වනජීවී කලාප කාර්යාල සහ දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන සංචාරක නිවාස සඳහා නව ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගන්නා ලදී. වැය විෂය අනුව වියදම් පහත වගුවේ දක්වා ඇත.

වගුව **10.1: කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ, සහ යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම - 2017**

| අනු අංකය | වැය විෂය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය(%) | මූල්‍ය ප්‍රගතිය(රු.මිලි.) |
|---|---|---|---|---|
| 1 | 284-1-1-0-2102 | කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ මිළදී ගැනීම | 99 | 5.83 |
| 2 | 284-1-1-0-2103 | යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම | 75 | 7.15 |
| එකතුව | | | | **12.98** |

## 10.3.වනජීවි සංරක්ෂණ අරමුදල (WPF)

වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකාව තුළ වනජීවි සංරක්ෂණ කටයුතු සඳහා සහය ලබාගැනීමේ අරමුණෙන් 1967 දී පිහිටුවන ලද මෙම අරමුදලේ අරමුණු පහත දැක්වේ.

1. වනසතුන් ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා මහජනතාවගේ දායකත්වය සහ සහයෝගය වැඩි කර ගැනීම
2. වනජීවි රක්ෂිත ප්‍රදේශ නඩත්තු කිරීම
3. වනජීවි සංරක්ෂණ සඳහා දක්වනු ලබන දායකත්වය අගය කිරීම සඳහා වනජීවි සංරක්ෂණ නිලධාරීන්ට සහ මහජනතාවට ත්‍යාග මුදල් සහ වෙනත් ප්‍රසාද දීමනා ගෙවීම.
4. වනජීවි අපරාධවලට එරෙහිව තොරතුරු ලබාදෙන්නන් සඳහා ප්‍රසාද දීමනා ගෙවීම.

වගුව 10.2හි දැක්වෙන්නේ වනජීවි සංරක්ෂණ අරමුදල එහි අරමුණු අනුව පෙර සැලසුම් කරන ලද වනජීවි සංරක්ෂණ කටයුතු සඳහා ලබාදුන් දායකත්වයයි. 2017 වර්ෂයේ වනජීවි සංරක්ෂණ අරමුදලේ අයවැය විස්තරාත්මකව 10.5 වගුවේ දක්වා ඇත.

වගුව **10.2: වනජීවි සංරක්ෂණ අරමුදලේ වියදම් (2013-2017)**

| වසර | ඇස්තමේන්තු ගත වියදම (රු.මිලියන) | සත්‍ය වියදම (රු.මිලියන) | වියදම් ප්‍රතිශතය(%) |
|---|---|---|---|
| 2013 | 799.40 | 412.00 | 51 |
| 2014 | 568.80 | 563.20 | 99 |
| 2015 | 1,245.42 | 600.46 | 48 |
| 2016 | 1,306.62 | 875.19 | 67 |
| 2017 | 1,205.73 | 943.14 | 78 |

## 10.4. සමස්ත මූල්‍ය ප්‍රගතිය - 2017

2017 වර්ෂය සඳහා වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළව අයවැය විස්තර පහත දැක්වේ

වගුව 10.3: **සමස්ත මූල්‍ය ප්‍රගතිය 2017-සාරාංශය**

| මූල්‍ය ප්‍රභවය | ඇස්තමේන්තුව (රු. මිලියන) | වියදම (රු. මිලියන) | මූල්‍ය ප්‍රගතිය(%) |
|---|---|---|---|
| මූලධන වියදම් | 758.80 | 662.69 | 87 |
| පුනරාවර්තන වියදම් | 1,116.65 | 1,113.68 | 100 |
| **එකතුව** | **1,875.45** | **1,776.37** | **95** |

**වගුව 10.4: 2017 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අයවැය විස්තර**

| විෂයාංකය | ව්‍යාපෘතිය/වැඩසටහන | ඇස්තමේන්තුව (රු.මිලි.) | වියදම (රු.මිලි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| **ප්‍රග්ධන වත්කම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම** | | | | |
| **284-01-01-2001** | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 35 | 25.15 | 72 |
| **2001-1** | රක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපිතකිරීම | | | |
| **2001-2** | පාරිසරික සංචාරක කළමනාකරණය | | | |
| **2001-3** | ජනවිහිදුම්කරණ වැඩසටහන | | | |
| **2001-4** | තොරතුරු හා සන්නිවේදන පද්ධතිය | | | |
| **2001-5** | වෙනත් ගොඩනැගිලි | | | |
| **284-01-01-2002** | මැෂින්, යන්ත්‍ර හා උපකරණ | 5 | 3.20 | 64 |
| **284-01-01-2003** | වාහන | 10 | 9.77 | 97 |
| **ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම** | | | | |
| **284-01-01-2102** | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 5.85 | 5.83 | 100 |
| **284-01-01-2103** | මැෂින් හා යන්ත්‍ර හා උපකරණ | 9.50 | 7.15 | 75 |
| **284-01-01-2104** | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 25 | 10.55 | 42 |
| **2105-1** | වනජීවී රක්ෂිත ප්‍රදේශ මැනුම් කිරීම හා වෙන් කිරීම | 20 | 15.75 | 79 |
| **284-01-01-2401** | හැකියාවන් ගොඩනැගීම | 24.60 | 24.25 | 99 |
| **2401-1** | පර්යේෂණ සහ පුහුණු | | | |
| **2401-2** | සංරක්ෂණය, අධ්‍යාපනය, විස්තාරනය හා ව්‍යාප්ති කටයුතු විවරණය | | | |
| **2401-3** | ආරක්ෂාව සහ නීති ක්‍රියාත්මක කිරීම | | | |
| **2401-4** | ගිරිතලේ ජාතික වනජීවී පුහුණු කේන්ද්‍රය | | | |

| විෂයාංකය | ව්‍යාපෘතිය/වැඩසටහන | ඇස්තමේන්තුව (රු.මිලි.) | වියදම (රු.මිලි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| **284-01-01-00-2506** | යටිතල පහසුකම් සංවර්ධනය | 10 | 2.13 | 21 |
| **284-01-01-08-2**105 | විදුලි වැට ඉදිකිරීම | 100 | 99.95 | 100 |
| **284-01-01-09-2506** | වනජීවීන් සඳහා වාසස්ථාන සුපෝෂණය | 100 | 77.55 | 78 |
| **284-01-01-10-2506** | ආරක්ෂිත කලාපයන්හි මාර්ග පද්ධතිය ස්ථාපනය කිරීම | 40 | 36.66 | 9 |
| **284-01-01-11-2105** | වන අලි මිනිස් ගැටුම අවම කිරිම | 373.85 | 344.71 | 92 |
| | **එකතුව** | **758.8** | **662.69** | **87** |

වගුව **10.5: 2017.12.31** දිනට වනජීවී සංරක්ෂණ අරමුදල් ගිණුමේ අයවැය

| විස්තරය | 2017 (රු.) | |
|---|---|---|
| 2017.01.01 දිනට ශේෂය | | **3,837,865,173.5**5 |
| **ලැබීම්** | | |
| උද්‍යාන පිවිසුම් ගාස්තු | 1,806,181,309.57 | |
| සේවා ගාස්තු | 302,123,332.60 | |
| වාහන පිවිසුම් ගාස්තු | 92,634,835.80 | |
| සංනිවේදන ගාස්තු | 612,615.12 | |
| සංචාරක බංගලාවන්හි රෙදිපිළි ගාස්තු | 3,150,250.00 | |
| කඳවුරුබිම් ගාස්තු | 1,623,941.94 | |
| පරිත්‍යාග | 2,797,189.82 | |
| පොත්, සඟරා සහ වාර ප්‍රකාශන | 93,613.85 | |
| සත්ත්ව හා ශාක කොටස් සඳහා ආනයන අපනයන බලපත්‍ර ගාස්තු | 862,100.00 | |
| උසාවිය විසින් නියම කරන ලද දඩ මුදල් | 35,123,400.00 | |
| කැපකරු මාපිය වැඩසටහන | 6,550,829.32 | |
| හීලෑ අලි ඇතුන් ලියාපදිංචිය | 27,250.00 | |
| ඇත් දළ ලියාපදිංචි කිරීම් | 16,000.00 | |
| ජාතික උද්‍යාන රූගත කිරීම් | 2,282,149.10 | |
| දැව සහ දර අලෙවිය | 512,751.50 | |
| ධීවර බලපත්‍ර | 65,500.00 | |
| වැලි විකිණීම | 20,089,650.00 | |
| ඇත්අතුරු සෙවනේ පහසුකම් ගාස්තු | 34,850,740.76 | |
| ආයෝජන මත පොලිය | 62,559,392.47 | |
| **ලැබීම් වල මුළු එකතුව** | | **2,372,156,851.85** |
| **ගෙවීම්** | | |
| ස්වෙච්ඡා මාර්ගෝපදේශක දීමනා | 72,674,935.66 | |

| | | |
|---|---|---|
| තත්කාර්ය කම්කරු දීමනා | 9,435,705.19 | |
| ගමන් වියදම් | 23,398,497.15 | |
| ඉන්ධන සඳහා | 40,058,344.76 | |
| ප්‍රසාද දීමනා (උසාවි දඩ මුදල් ලැබීම් වලින්) | 11,982,738.67 | |
| අලි පිළිස්සීම | 933,667.00 | |
| මහජනයාට සතුන්ගෙන් වන හානි සඳහා වන්දි | 11,373,548.00 | |
| අලි වෙඩි මිලදී ගැනීම | 69,548,195.47 | |
| අලි පළවාවැරීමේ වියදම් | 6,393,127.36 | |
| සතුන් සඳහා ආහාර | 60,372,378.33 | |
| සේවාගාස්තු | 245,795,270.42 | |
| වාහන අලුත්වැඩියාව | 31,897,971.19 | |
| ජලය හා විදුලිය | 8,768,100.86 | |
| තුවක්කු බලපත්‍රය | 178,000.00 | |
| වඳවීමේ තර්ජනයට ලක් වූ ජීවී විශේෂ සංරක්ෂණය | 4,844,648.12 | |
| ගුවන්විදුලි පණිවිඩ | 3,767,266.71 | |
| බංගලාවල රෙදි පිරිසිදු කිරීමේ වියදම් | 994,016.00 | |
| නීතිඥ ගාස්තු | 366,000.00 | |
| විවිධ වියදම් | 9,489,210.12 | |
| යන්ත්‍ර උපකරණ, විදුලි උපකරණ ,ගොඩනැගිලි යනාදිය නඩත්තුව | 78,534,510.39 | |
| වෛද්‍ය සැපයීම් | 6,420,943.94 | |
| ජාතික උද්‍යානවල කාර්යාලීය වියදම් | 2,819,639.67 | |
| නිලධාරීන්ගේ ජීවිත හා ශාරීරික හානි සඳහා වන හානි | 577,690.00 | |
| උද්‍යානවල සංචාරකයින්ගේ හා සතුන්ගේ පහසුකම් වැඩි දියුණු කිරීම | 91,260,886.30 | |
| වාහන මිළදී ගැනීම | 5,451,100.00 | |
| සංචාරක නිවාස පවත්වාගෙනයාම | 5,714,613.97 | |
| විදේශීය පුහුණු | 41,048,227.47 | |
| දිරි දීමනා | 56,013,763.32 | |
| සම්මුති සම්මන්ත්‍රණ | 6,405,664.82 | |
| ජනවිඥිදුම්කරණ | 5,364,860.42 | |
| සමුද්‍රජීවී සංරක්ෂණය | 3,847,247.19 | |
| වාසස්ථාන සුපෝෂණ කටයුතු | 1,539,823.53 | |
| වනජීවීන් සම්බන්ධ පර්යේෂණ කටයුතු | 25,663,330.81 | |
| භාණ්ඩාගාර බිල්පත් (ආයෝජන මත පොළිය) | 62,559,392.47 | |
| **ගෙවීම් මුළු එකතුව** | **1,005,493,315.31** | |
| **2017.12.31 දිනට ශේෂය** | | **5,204,528,710.09** |

# පරිච්ඡේදය 11

## පරිසර පද්ධති සංරක්ෂණ හා කළමණාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

ලෝක බැංකු ආධාර මත පරිසර පද්ධති සංරක්ෂණ හා කළමණාකරණ ව්‍යාපෘතිය (ESCAMP) 2017-2021 දක්වා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා ඇමෙරිකන් ඩොලර් මි. 45ක ප්‍රතිපාදන වෙන් වී ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ තෝරාගත් රක්ෂිත ප්‍රදේශවල ඇතුලත හා පිටත ගොඩබිම්, සමුද්‍රීය සහ තෙත් බිම් පරිසර පද්ධති කළමනාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම වේ.

### 11.1 ප්‍රධාන ව්‍යාපෘති සංරචක

- **1 වන සංරචකය නියමු භූ සැලසුම සහ කළමනාකරණය**

මෙම සංරචකය තුළින් සුවිශේෂී පරිසර විද්‍යාත්මක, සංස්කෘතික සහ සමාජ ආර්ථික ලක්ෂණ සමග ඉගෙනුම් අභ්‍යාස ආදර්ශයක් ලෙස තෝරාගන්නා ලද ජෛව විවිධත්වයෙන් පොහොසත් කලාප දෙකක (වියළි කලාපයේ සහ තෙත් කලාපයේ) කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසයි. භූ කළමනාකරණ සැලසුම් තුළට ආරක්ෂිත ප්‍රදේශවල (Pas)වාසභූමි සහ ජෛවවිවිධත්වය වැඩි දියුණු කිරීම සහ එහිදී ශ්‍රී ලංකා රජයේ ජාතික සහ ආංශික සැලසුම් සමග අනුගත වීම අයත් වේ. එමෙන්ම පහත ක්‍රියාමාර්ග ඔස්සේ කළමනාකරණ උපක්‍රමයන් ක්‍රියාත්මක කිරීමේදී මතුවන අභියෝග, අවස්ථා සහ අවශ්‍යතා හඳුනාගැනීම සහ තාක්ෂණික සහය සැපයීමෙන් තිරසර ඉඩම් පරිහරණ කළමනාකරණය සහ සැලසුම්කරණය ශක්තිමත් කිරීම, භූ මට්ටමේ කළමනාකරන සැලසුම්කරණය සඳහා වන මාර්ගෝපදේශන රාමුවක් සංවර්ධනය කිරීම සඳහා පුහුණුව සහ හැකියා වර්ධන ලබාදීම, සහ භූ සැලසුම්කරණය සහ කළමනාකරණය නියමු කිරීම:

1. විවිධ පරිපාලන සීමාවන් පිළිබඳව සලකා බැලීමකින් තොරව භූමිය පුරා පවතින පරිසර පද්ධති කළමනාකරණ ගැටළු/වෙනස්කම් හඳුනාගැනීම.
2. භූමිය තුළ පවතින අවස්ථා සහ සංරක්ෂණ ක්‍රියාමාර්ගයන්ට සිදුවන බාධාවන් අර්ථ දැක්වීම
3. වලදායී පරිසර විද්‍යාත්මක ජාල හඳුනාගැනීම
4. පරිසර පද්ධතිවල සම්පූර්ණත්වය සහ සත්ව විශේෂ ගහණය ආරක්ෂා කිරීමේ ක්‍රියාමාර්ගයන් හඳුනාගැනීම.
5. වටිනා පරිසර පද්ධති සංරක්ෂණය කිරි හඳුනාගැනීම ඇතුළුව භූමි පරිමාණ පරිසර

පද්ධති ගුණාත්මක බව සඳහා කඩිනම් ඇගයීම් ක්‍රමයක් සංවර්ධනය කිරීම

6. ඉඩම් සම්පත් පරිහරණ තීරණ සඳහා හා එවැනි භූමි එළඹුම් තුළ වන හුවමාරු කිරීම් තුලනය කරන ඵලදායී පාර්ශ්වකරු කතිකා රාමුවක් සැකසීම
7. ජෛව විද්‍යාත්මක මායිම් සහිත ප්‍රදේශ තුළ උපරිපතනය වන සංස්කෘතික, සමාජ සහ පාලන "භූමිය" හඳුනාගැනීම සහ භාවිත කිරීම.
8. ක්‍රියාත්මක කිරීම සඳහා විස්තීර්ණ භූමි කළමනාකරණ සැලසුම් සංවර්ධනය කිරීම.

- **2 වන සංරචකය: ස්වභාවික සම්පත් තිරසර ලෙස පරිහරණය කිරීම සහ මිනිස් අලි සහජීවනය**

  මෙම සංරචකය මගින් වන විනාශය අවම කිරීම සඳහා ජෛව විවිධත්වයට ගැලපෙන ඵලදායී ජීවනෝපාය ක්‍රියකාරීත්වයන් ප්‍රවර්ධනය කරයි. ස්වභාවික සම්පත් පරිහරණය සැලසුම් කිරීම සහ ආරක්ෂිත ප්‍රදේශවලට (PAs) යාබදව සිටින වනජීවීන් සමග සමීප සබඳතාවයක් පවතින ප්‍රජාවන්ගේ අවශ්‍යතාවයන්ට පිළිතුරු ලබාදෙමින් අලි මිනිස් ගැටුම, අලි මිනිස් සහජීවනය බවට පත් කිරීම.

- **3 වන සංරචකය: ව්‍යාපෘති ප්‍රදේශය කළමනාකරණය කිරීම සහ ආයතනික ධාරිතා සංවර්ධනය**

  වන සත්ත්ව සහ වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත සහ වන ආඥා පනත අනුව ආරක්ෂිත ප්‍රදේශවල ඉල්ලුම මත පදනම් මැදිහත් වීමක් සඳහා සහය දැක්වීම, ආයතනික ධාරිතාව සහ සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා ආයෝජන හැකියාව ශක්තිමත් කිරීම සහ ආරක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සඳහා දීර්ඝ කාලීන මූල්‍ය තිරසර භාවය සංවර්ධනය කිරීමට සහය ලබාදීම.

- **4 වන සංරචකය: ව්‍යාපෘති කළමනාකරණය**

  මෙම සංරචකය මගින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ වර්ධක මෙහෙයුම් අරමුදල් ලබාදීම, උපදේශන සේවා සැපයීම, ප්‍රවාහනය සහ උපකරණ සැපයීම තුළින් ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සහ ඇගයීම පරිපාලනය, සැලසුම් අයවැයකරණය, භාරකරු ක්‍රියාමාර්ග, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරක්ෂා කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම වැනි මාතෘකා ගණනාවක් ආවරණය කරමින් පරිපාලකයන් පුහුණු කිරීම යනාදිය තුළින් ක්‍රියාත්මක නියෝජිතායතන වෙත අරමුදල් ලබාදීම සිදු කෙරේ.

## 11.2 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ යටතේ ක්‍රියාත්මක විමට නියමිත ව්‍යාපෘති

- **වනජීවී කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම**

  ගිරිතලේ පිහිටි ජාතික වනජීවී පර්යේෂණ සහ පුහුණු කේන්ද්‍රය තුළින් වනජීවී නියාමකවරුන්ගේ ධාරිතාවන් සංවර්ධනය කිරීම සඳහා වනජීව සංරක්ෂණ දෙපාර්තමේන්තුව මාස නවයක ඩිප්ලෝමා පාඨමාලාවක් පවත්වනු ලබයි. මෙම ඩිප්ලෝමා පාඨමාලාව පළමු වරට පවත්වන ලද්දේ ඉන්දියාවේ වනජීවී ආයතනයේ (WII) තාක්ෂණික සහය සමග 1993 දී වූ අතර එහි අරමුණ වූයේ වනජීවී සම්පත් සංරක්ෂණයේ යෙදෙන නිලධාරීන් වෙත දැනුම ලබාදීමයි. ආරම්භයේදී ඉන්දියාවේ වනජීවී ආයතනය මගින් පාඨමාලා දෙකක් පවත්වනු ලැබූ අතර ඉන්පසු කොළඹ විශ්ව විද්‍යාලයේ සමග එක්ව පවත්වන ලදී. ඉන්පසු පාඨමාලා දෙකක් විශ්ව විද්‍යාලය මගින් සහ ජාතික වනජීවී පර්යේෂණ සහ පුහුණු කේන්ද්‍රය මගින් පවත්වන ලදී.

- **යාල සංකීර්ණය සඳහා වාසභූමි කළමනාකරණ සැලසුම (යාල සහ ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය)**

  මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වූයේ හෙක්ටයාර් 1,000 ක ආක්‍රමණශීලි ශාක ඉවත් කිරීමෙන්, 2,020 වන විට හෙක්ටයාර් 1,500 ක ආක්‍රමණශීලි ශාක ඉවත් කර පවත්වාගැනීම සහ අලින් හා වෙනත් විශාල ශාකභක්ෂකයන් සඳහා වඩා වැඩි ආහාර ලබාගැනීමකට ඉඩ ලබාදීම තුළින් යාල ජාතික උද්‍යානයේ හි ධාරක ධාරිතාව වැඩි කිරීමෙන් වනෝද්‍යානයේ වාසභූමි ගුණාත්මක බව වැඩි කිරීමයි.

- **උඩවලව ජාතික වනෝද්‍යානයේ වාසභූමි කළමනාකරණය**

  මෙම යෝජනාව මගින් අලින් සඳහා ලද හැකි යහපත් වාසභූමි ආරක්ෂා කිරීම සඳහා වන ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන එයි. මෙම සැලසුම මගින් වෙනත් විශාල ශාක භක්ෂකයන්ටද වඩා ගුණාත්මක වාස භූමි ලැබෙනු ඇත.

- **ශ්‍රී ලංකාවේ වනජීවී ආරක්ෂිත ප්‍රදේශ සඳහා සුහුරු මුරසංචාර මෙවලමක් හඳුන්වා දීම**

  ව්‍යාප්ති අධීක්ෂණ සහ වාර්තාකරණ මෙවලම (SMART) යනු වනජීවී නීති ක්‍රියාත්මක කරන මුර සංචාර සහ වැඩබිම් පදනම් සංරක්ෂණ ක්‍රියාකාරකම්වල ඵලදායීතාව මැනීමේ, ඇගයීමේ සහ වැඩි දියුණු කිරීම සඳහා ගෝලීයව භාවිතා කරන පරිගණක යෙදුමකි. SMART මෙවලම, මුර සංචාරය කරන අතර ක්ෂේත්‍ර දත්ත එක් රැස් කිරීමට මුර සංචාරක කණ්ඩායම්වලට සහය ලබාදෙයි. එම දත්ත වඩා දියුණු ආරක්ෂාවක් සඳහා ඇගයීම, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට භාවිතා කෙරේ. ශ්‍රී ලංකාව තුළ වනජීවී රක්ෂත

ප්‍රදේශ හි භාවිතා වන නීති ක්‍රියාත්මක කිරීමේ උපක්‍රමයන්ට SMART හඳුන්වා දීමෙන් වනජීවී සම්පත් ආරක්ෂාව සහතික කරන උත්සාහයන් අනාගතයේදී ශක්තිමත් කිරීමට උපකාරී වනු ඇත.

- **යාල ජල මූලාශ්‍රයන් සංවර්ධනය කිරීම**

  මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ වනජීවීන් මානව ජනාවාස වෙත සංක්‍රමණය වීම අවම කිරීමයි. සතුන් සඳහා වන ජල දේහයන් ඉදිකිරීම සහ පිළිසකර කිරීම තුළින් සතුන්ට ජලය ලබාගත හැකි බව සහ ජල ව්‍යාප්තිය වැඩි කිරීම, නව තෙත් බිම් වාසභූමි ඇතිකිරීම මගින් ජෛව විවිධත්වය වැඩි දියුණු කිරීම, වාසභූමිවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සහ වනෝද්‍යානය තුළ වාසභූමි උපයෝගීතාවය වැඩි කිරීම මගින් මෙම ගැටළුවට පිළිතුරු ලබාදෙනු ඇත.

- **වන අලි ව්‍යාප්තිය, සැරිසර රටාව ඇගයීම සහ අධීක්ෂණය**

  මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ අලි ව්‍යාප්තිය සහ සැරිසර රටාව සම්බන්ධව විස්තීර්ණ දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීම වන අතර ශ්‍රී ලංකාවේ වල් අලි ව්‍යාප්තිය සම්බන්ධ අඛණ්ඩ අධීක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ WASL හි, අවශ්‍ය උපකරණ සහ පුහුණු කාර්ය මණ්ඩලයක් සහිතව අධීක්ෂණ ඒකක ස්ථාපිත කිරීම සහ ප්‍රාදේශීය මට්ටමින් අලින්ගේ සෞඛ්‍ය අධීක්ෂණ වැඩසටහනක් ස්ථාපිත කිරීම, මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වෙයි.

- **ගැටළු සහිත අලින් පරිසංක්‍රමණය සඳහා ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානයේ 2 වන රඳවාගැනීමේ බිම ස්ථාපිත කිරීම**

  මිනිස් අලි ගැටුම් තුරන් කිරීම පිණිස ගැටළු සහගත අලින් සුවපත් කර පසුකාලීනව සම්පූර්ණයෙන්ම නිදහස් ලෙස සරන ලෙස වනයට මුදාහැරීමේ අරමුණ සහිතව හෙක්ටයාර 3,000 ක ප්‍රමාණයක් තුළ ස්වභාවික වන තත්ත්වයන් සකසා නිදහසේ සැරීමට හැකිවන් පරිදි අලින් රඳවනු ලැබේ.

- **ගල් ඔය ජාතික වනෝද්‍යානය ආරක්ෂා කිරීම**

  අලින් සහ ජෛව විවිධත්වය සඳහා බලපාන සංරචකයන්ගේ දීර්ඝ කාලීන පැවැත්ම සහතික කිරීම පිණිස ගල් ඔය ජාතික වනෝද්‍යානේ ස්වභාවික සම්පත් සහ වාසභූමි සංරක්ෂණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

**11.3 2017 වසරේදී මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද කාර්යන්ගේ ප්‍රගතිය**

- **සංරචක 2a**

**වගුව 11.1 වනජීවී රක්ෂිත ප්‍රදේශ අවට ජනතාවගේ ජීවණෝපාය සංවර්ධනය කිරීම (ඇමෙරිකන් ඩොලර් මි. 6)**

| කාර්යයන් | ඇස්තමේන්තුව 2017(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| බුන්දල ජා.උ අවට ගම්මානවල ජනතාව සඳහා ක්ෂුද්‍ර සැලසුම 05ක් සකස් කිරීම | 2.1 | 0.95 | • ක්ෂුද්‍ර සැලසුම 05ක් අවසන් කර ඇත ,<br>• ප්‍රජා උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම කෝන්වලාන සහ නෙදිගම්ගම්විල බොහෝදුරට අවසන් කර ඇත.<br>• දකුණ වනජීවී කලාපයෙන් පරිබාහිර කලාපයන්හි සේවයේ නියුතු වනජීවී නිලධාරි ප්‍රජා ක්‍රියාකාරකම් සඳහා සංවේදී කිරීමේ වැඩසටහන් 01ක් පවත්වා ඇත. |

- **සංරචක 2b**

**වගුව 11.2 අලි-මිනිස් සහ පැවත්ම තුලින් වනඅලි හානි අවම කිරිම (ඇමෙරිකන් ඩොලර් මි. 11)**

| කාර්යයන් | ඇස්තමේන්තුව –2017(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| වනඅලි සංගණනය | 5 | - | වැඩමුළු 02ක් පවත්වා ඇත (1%) |
| වනඅලින්ගේ සංක්‍රමන රටාව අධීක්ෂණය කිරීම | 25 | - | හඳුනාගත් වනඅලින් 40ක් සඳහා GPS කරපටි මිල දී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවති (10%) |
| ලුණුගම්වෙහෙර ජා.උ. වනඅලි සංරක්ෂණ උද්‍යානය ඉදි කිරීම | 150 | - | ඇස්තමේන්තු සකස් කරමින් පවතී (3%) |

**සංරචක 3a**

**වගුව 11.3 වනජීවී රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය සහ කළමනාකරණය (ඇමෙරිකන් ඩොලර් මි. 11.6)**

| කාර්යයන් | ඇස්තමේන්තුව 2017 (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| යාල ජා.උ. ජල ප්‍රභවයන් වැඩි දියුණු කිරීම | 50 | | කුඩා වැව් 12ක්, ගල්කෙම් 04ක් හා ක්‍රොන්කීට් වතුර වලවල් 07ක් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී |
| වනජීවී රක්ෂිත ප්‍රදේශවල වනජීවී අපරාධ මැඩලීම සඳහා SMART patrolling ක්‍රමය යොදා ගැනීම | 5 | 8.99 | මූලික පුහුණු වැඩයටහන්, උපකරණ සහ උපාංග මිල දී ගැනීම සහ යාල සහ උඩවලව ජා.උ. දත්ත එක්තු කිරීම අවසන් කර ඇත. මූලික වැටලීම් ඒකක 07ක් දැනට ස්ථාපනය කර ඇත (40%) |
| වනජීවී රක්ෂිත ප්‍රදේශවල කළමණාකරනය සඳහා යටිගල පහසුකම් සංවර්ධනය හා වැඩි දියුණු කිරීම | 20 | | ව්‍යාපෘති යෝජනා සකස් කරමින් පවතී (1%) |

- **සංරචක 3b**

**වගුව 11.4 වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කටයුතු වැඩි දියුණු කිරීම (ඇමෙරිකන් ඩොලර් මි. 6)**

| කාර්යයන් | ඇස්තමේන්තුව 2017(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| යාල සහ බූන්දල ජා.උ. පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය කිරීම | 22.0. | | ව්‍යාපෘති යෝජනා සකස් කරමින් පවතී (1%) |

● සංරචක 3c

**වගුව 11.5 ආයතන ධාරිතාව සහ ආයෝජන හැකියාව වර්ධනය කිරීම (ඇමෙරිකන් ඩොලර් මි. 6.6**

| කාර්යයන් | ඇස්තමේන්තුව 2017(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය | 40 | - | තාක්ෂණ උපදේශකයින් තෝරාගෙන් ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී (5%) |
| වනජීවී සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ ඩිප්ලොමා පාඨමාලාව | 8.0 | 11.48 | ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ සය මාසික පාඨමාලාව පවත්වාගෙන යමින් පවතී (60%) |
| දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා වසර පහක පුහුණු සැලසුමක් පිළියෙල කිරීම | - | - | සකස්කර අවසන් කර ඇත (100%) |
| WILDLANKA පර්යේෂණ සම්මන්ත්‍රණය | 2.5 | 1.85 | 2017 .වසරේ පර්යේෂණ සම්මන්ත්‍රණය 2017.08.15 සහ 16 දිනවල කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේදී පවත්වන ලදී (100%) |
| ආයතන සහ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම (පුහුණු, උපකරණ සහ වාහන) | 4.0. | - | ඩබල් කැබ් 05ක් මිල දී ගෙන ඇත (100%)<br><br>කාර්යාලීය උපකරණ මිල දී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී (10%) |